# "සියක් අවුරුදු අධ්‍යයනයෙන් 2030ට"

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් මානව සංවර්ධනය
කෙරෙහි දක්වා ඇති දායකත්වය පිළිබඳ සමීක්ෂණය
2020

**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

**සියළුම හිමිකම් ඇවිරිණි**
**ප්‍රථම මුද්‍රණය 2021 මැයි**

**"සියක් අවුරුදු අධ්‍යයනයෙන් 2030ට"**
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
තරුණ සහ ක්‍රීඩා අමාත්‍යාංශය

මෙම කෘතියෙහි අන්තර්ගත කරුණු නිවැරදිව ඉදිරිපත් කිරීමට සෑම අතින්ම උත්සාහ ගෙන ඇත. එහෙත් මෙහි අඩංගු කරුණු වල නිවැරදි බව, අංගසම්පූර්ණ බව පිළිබඳව නියෝජනයක් හෝ සහතික වීමක් නොකරමු. මෙහි අන්තර්ගතයෙහි අඩංගු කරුණු වල යම් වරදකට මග හැරීමකට හා මෙහි සිදුවන යම් කරුණක් පදනම් කරගෙන සිදුවන අලාභයකට හෝ හානියකට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

වියාචනය
මෙම ප්‍රකාශනයේ ලිපි, අධ්‍යයන සහ වෙනත් දායකත්වයන් එහි දැක්වෙන අදහස් තනිකරම කර්තෘවරුන්ගේ පෞද්ගලික අදහස වන අතර මෙම ප්‍රකාශන හරහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා ඔවුන්ගේ ප්‍රකාශන අදහස් අනුමත කිරීමට බැඳී නො සිටී.

*Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper*
*(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)*

*Recycling one ton of paper saves*
*17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.*

*Printed By PRINTEC ESTABLISHMENT (PVT) LTD | 0112 815 816 | salesprintec@gmail.com*

## විධායක සාරාංශය

මානව සම්පත් සංවර්ධනය සඳහා ජාතික පුවත්පත් දක්වා ඇති දායකත්වය පිළිබඳව විශ්ලේෂණාත්මක අධ්‍යනයක් සිදු කිරීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් "සියක් අවුරුදු අධ්‍යනයෙන් 2030 ට "නමින් පර්යේෂණයක් ආරම්භ කරන ලදී. මේ සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වසර සියයක කාලපරාසය තුළ සිදුවූ සුවිශේෂී සංධිස්ථාන ඉලක්ක කර ගනිමින් පුවත්පත් තෝරා ගැණින. එම පුවත්පත්වල විවිධ ක්ෂේත්‍ර 30ක් යටතේ පළකරන ලද ලිපි මෙහිදී අධ්‍යනය සඳහා යොදා ගන්නා ලදී. මෙහි දත්ත එක් රැස් කිරීම ප්‍රධාන කාර්යාලයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් 29 දෙනෙකුගේ දායකත්වයෙන් සිදුවිය. දත්ත එක්රැස් කිරීමට සහ එක්රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කරමින් පර්යේෂණ වාර්තාව සකස්කිරීම සඳහා මාස 03 කාලයක් ගතවිය.

එමෙන්ම මෙම පර්යේෂණය යටතේ පුවත්පත් පාඨකයින්ගේ මතය පිළිබඳව ද අධ්‍යනය සිදු කළ අතර ඒ සඳහා දිස්ත්‍රක්ක 20ක් නියෝජනය කරමින් පාඨකයින් 5010 දෙනෙකුගේ තොරතුරු ලබා ගැනීම සිදුවිය. මේ සියලු දත්ත අධ්‍යනයෙන් මෙම පර්යේෂණ වාර්තාව පරිපූර්ණ වාර්තාවක් බවට පත්කර ගැනීමට හැකි විය.

මෙම පර්යේෂණය මඟින් එළඹියාවූ නිගමනයන් මෙම විෂයය පිළිබඳ ප්‍රාමාණික දැනුම සහිත විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙත යොමු කළ අතර ඒ පිළිබඳව ඔවුන් දක්වන ලද අදහස් ද මෙහි ඇතුළත් කර ඇත.

වසර සියයක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් මානව සම්පත් සංවර්ධනයට දක්වා ඇති දායකත්වය පර්යේෂණාත්මකව අධ්‍යනය කිරීම සිදුවූයේ අරමුණු කිහිපයක් අපේක්ෂාවෙනි. ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර එම දත්ත විශ්ලේෂණය මඟින් පුවත්පත් මානව සම්පත් සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය අනාවරණය කර ගැනීම සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ලිපි වෙනුවෙන් ජාතික පුවත්පත් අවකාශයෙන් වැඩි ප්‍රමාණයක් වෙන් කිරිම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට යොමු කිරීම මෙහි ප්‍රධාන අරමුණු විය.

# හැඳින්වීම

## 1.1 ලාංකීය පුවත්පත් ආරම්භය සහ විකාශනය

පරිණාමයේ සුවිශේෂී කඩඉම් පසු කරමින් ආ මානවයා තම අදහස් අනෙකා වෙත සම්ප්‍රේෂණය කිරීමට විවිධාකාර වූ සන්නිවේදන ක්‍රම භාවිත කළ අතර වර්තමානයේ ඒ පිළිබඳව විද්‍යාත්මකව හදාරනු ලබන විෂයය ක්ෂේත්‍රය ලෙස ජන සන්නිවේදන විෂයය බිහිවී ඇත. එය ප්‍රධාන කොටස් දෙකක් ඔස්සේ එනම් විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය ලෙස අධ්‍යයනය කරනු ලබයි. ඉන් මුද්‍රිත මාධ්‍ය ගණයට අයත් වන පුවත්පත පාඨක ජනතාව සමග වඩා ලෙන්ගතුව හා පරිස්සම් සහගතව ලග තබා ගත හැකි , අවශ්‍ය වූ විට නැවත කියවිය හැකි, මිතුරෙකු ලෙස බැඳී පවතී. එය පුවත්පත සතු සුවිශේෂී ගුණාංගයකි. වසර දෙසීයකට ආසන්න ඉතිහාසයකට හිමිකම් කියනු ලබන ලාංකීය පුවත්පත් කලාව පිළිබඳව විමසීමට පෙර ලෝකයේ පුවත්පත් කලාව බිහිවීම පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම වඩා යෝග්‍ය වේ.

ලොව මෙතෙක් පළවී ඇති පුවත්පත් අතරින් පළමු තැන හිමිවන්නේ කවරකටදැයි යන්න පිළිබඳව විවාදාත්මක මත පළවී ඇති අතර රෝම ඉතිහාසයේ සඳහන් වන්නේ " අක්ටා දියුර්නා" (Acta Diurna) නමින් රාජ්‍ය නිවේදන, ජුලියස් සීසර් සමයේ මහජනතාව වෙත නිකුත් කරන ලද බවයි. එසේම චීනයේ පැරණි රජයන් විසින් Tipao ලෙස පුවත් පත්‍රිකා භාවිත කර ඇති අතර පසු කාලීනව හන් රාජවංශය , ටැං රාජවංශය හා මිං රාජවංශය පුවත් පත්‍රිකා නිකුත් කර ඇති බවට සාක්ෂි පවතී. එසේ වුවද ලෝක පුවත්පත් සම්මේලනය මගින් Johann Caroalus ගේ The Relation aller (Furnemmen und gedenckwurdign Historien) නමින් 1605 දී නිකුත්වූ පුවත්පත ලොව පළමු පුවත්පත ලෙස පිළිගෙන ඇත.

ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව පිළිබඳව විමසීමේ දී 1802 වර්ෂයේ මාර්තු මාසයේ දී ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රය ලෙසින් ආණ්ඩුවේ නිල නිවේදන හා පරිපාලන තොරතුරු සහිත වාරික ප්‍රකාශ නිකුත් වී ඇත. ලංකාවේ ප්‍රථම පුවත්පත ලෙසින් සැලකෙන්නේ (Colombo Journal) නමින් 1832 වර්ෂයේ ජෝන් ලී ගේ සංස්කරණය යටතේ නිකුත් වූ පුවත්පතයි.

ලංකාවේ පුවත්පත් කලාව වර්ධනය, එහි වෙනස්කම්, අන්තර්ගතය වැනි කරුණු අනුව අදියර කිහිපයක් ඔස්සේ හඳුනාගැනීමට පුළුවන. එහිදී 1800 - 1860 දක්වා යුගය මෙරට පුවත්පත් කලාවේ ආරම්භක අවධිය ලෙසින් හැඳින්විය හැකිය. ද කලම්බු ජර්නල් පුවත්පතට අමතරව 1834 වර්ෂයේ ආරම්භ කර ඇති ඔබ්සර්වර් ඇන්ඩ් කොමර්ෂල් ඇඩ්වර්ටයිසර් (The Observer and Commercial Advertiser) පුවත්පතද මෙරට පළ වී ඇත. මෙම කාලය තුලදී අධ්‍යාපන හා ආගමික කරුණු ප්‍රධාන කොට ගනිමින් පුවත්පත් නිර්මාණය වී ඇත. එමඟින් මිෂනාරි ක්‍රිස්තියානි ආගම ප්‍රචලිත කිරීම සඳහා පුවත්පත් භාවිත කළ බව ද විශේෂ කොට හඳුනාගත හැකිය.

පුවත්පතකට වඩා පොතක හැඩය ගත් "ලංකා නිධානය" පළමු සිංහල පුවත්පත ලෙස අර්ථ දක්වනු ලබන බව ද සිංහල සාහිත්‍ය වංශයේ සඳහන් වේ. එම කාලවකවානුව තුළ මුද්‍රණය වූ පුවත්පත් හා සඟරා සියල්ලට ම වැඩි අවධානය යොමු කර ඇත්තේ ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරණය සඳහා වන අතර එනිසාම බෞද්ධ මුද්‍රණාල ඇතිවීමත් ආගම මුල් කර ගනිමින් ලේඛන කලාවේ නව පුනරුදයක් බිහිවීම හඳුනාගැනීමට පුළුවන. මේ හේතුවෙන් පාඨක ප්‍රජාවගේ කියවීමේ රුචිය වැඩි වීමත් එකල විශේෂ ලක්ෂණයක් ලෙසින් හඳුනා ගැනීමට පුළුවන.

ලංකාවේ ඉංග්‍රීසි පුවත්පත් බිහිවී දශක කිහිපයකට පසු, ප්‍රථම සිංහල පුවත්පත බිහි වී ඇත. ඒ 1860 වර්ෂයේ "ලංකාලෝක" නමිනි. ආගමික වාද විවාද හා ශාස්ත්‍රීය වාද විවාද යටතේ නව පරිච්ඡේදයක ආරම්භයක් සමග බෞද්ධයන්ට සිදු වන පහර ගැසීම් වළක්වාලීම සඳහා මෙම පුවත්පත බුලත්ගම ධම්මාලංකාර හිමිගේ ප්‍රධානත්වයෙන් බිහි වී ඇත.

එසේ වුවද රජයේ ලියාපදිංචි කරන ලද පළමු පුවත්පත වනුයේ "ලක්මිණි පහන" වේ. 1866 වර්ෂයේ ආරම්භ කරන ලද "ඥානාර්ථ ප්‍රදීපය" පුවත්පත කතෝලික දහම ප්‍රචාරය කිරීමේ අරමුණින් ආරම්භ කර ඇති අතර, එයින් නැගුණු ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා " සත්‍ය මාර්ගය " නමින් 1867 වර්ෂයේ තවත් පුවත්පතක් ආරම්භ කර ඇත.

පුවත්පත් ඉතිහාසය පිළිබඳව විමසීමේදී පුවත්පතක් මගින් අපේක්ෂිත විනෝදාස්වාදය සැපයීම සඳහා කවට පුවත්පත් ආරම්භ කිරීම විශේෂ සන්ධිස්ථානයක් ලෙස දැක්විය හැකිය. ඒ 1871 වර්ෂයේ ජී.ඩී. පැලිස් අප්පුහාමි විසින් "කවට කථිකයා" පුවත්පත බිහි කිරීමයි. ඒ ඔස්සේ යමින් එම ගණයේ පුවත්පත් කිහිපයක් බිහි වී ඇත.

ලංකාවේ ප්‍රථම වරට දිනපතා පුවත්පතක් ලෙස ආරම්භ වී ඇත්තේ "දිනපතා ප්‍රවෘත්ති" නම් පුවත්පතයි. ඒ 1890 වර්ෂයේය. එසේම මෙකල විවිධ විෂයන් යටතේ පුවත්පත් බිහිවීම හඳුනාගත හැකි විශේෂ ලක්ෂණයකි. ඒ අතර ගොවිපති සඟරාව, විද්‍යා දර්ශන සඟරාව, ලංකා කම්කරු ප්‍රබෝධය වැනි පුවත්පත් විශේෂ තැනක් ගනී. මෙම කාලයේ ජාතික හැඟීම් පුබුදුවාලමින් විදේශිකයින්ගෙන් මිදීමට උත්සාහ දැරීම සඳහා පුවත්පත් පෙරමුණගත් බවද විශේෂයෙන් හඳුනාගැනීමට හැකිය.

දිනපතා පුවත්පත් ලෙස 1909 වර්ෂයේ "දිනමිණ" එම්.එච්. පෙරේරා මහතා විසින් ආරම්භ කිරීමෙන් පසුව ඩී.ආර්. විජේවර්ධන මහතා විසින් 1914 වර්ෂයේ එම පුවත්පත් ආයතනය මිළ දී ගැනීමත් ඒ සමඟම සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම බිහි වීමත් විශේෂිත වේ. එවකට පැවති ටයිම්ස් ආයතනය අභිබවමින් දේශීයත්වයට මුල්තැන දුන් ආයතනයක් ලෙසත්, ලේක්හවුස් සමාගම විසින් ඩේලි නිවුස් සහ සිලෝන් ඔබ්සර්වර් වැනි පුවත්පත් මිළ දී ගැනීමත් ලංකාවේ පුවත්පත් කලාව නව මාවතක් ඔස්සේ ගමන් කිරීමක් ලෙස මෙහි දී හඳුන්වා දිය හැකිය.

1930 වර්ෂයේ " ශත දහයේ විශ්වවිද්‍යාලය " නමින් හඳුන්වනු ලැබූ ඉරිදා පුවත්පතක් ලෙස "සිළුමිණ" පුවත්පත පියසේන නිශ්ශංක මහතාගේ කර්තෘවයෙන් බිහිවීම ද පුවත්පත් කලාවේ නව පිබිදීමකට හේතුවිය. එමෙන්ම ටයිම්ස් ආයතනය මඟින් 1947 වර්ෂයේ ලංකාදීප පුවත්පත ආරම්භ කිරීමත් එමගින් සිංහල පුවත්පත් කලාව අතර තරඟයක් ගොඩනැගීමත් දක්නට ලැබිණි. එම පුවත්පත දිණමින පුවත්පතටත් වඩා දේශියත්වයට ලංවෙමින් සඟ, වෙද, ගුරු, ගොවි හා කම්කරු යන පංච මහා බලවේග තුළට ජනතාව ගොනු කරමින් ඔවුන්ගේ චින්තනය ඒ සඳහා මෙහෙයවීමට කටයුතු කර ඇති බව ද පැහැදිලිව හඳුනාගැනීමට හැකිවේ. 1948 කාල වකවානුව නිදහස ලබා ගැනීමත් සමග පුවත්පත් කලාව විශේෂ සංධිස්ථාන රැසක් පසු කිරීමද හඳුනාගත හැකිය. ඒ මෙරට තුළ ප්‍රධාන පෙළේ පුවත්පත් ආයතන බිහි වීමත්, දේශපාලන කටයුතු වලට උද්යෝගයෙන් නැඹුරු වීමත්, වාමාංශික ව්‍යාපාරය වර්ධනයත් ඒවා පුවත්පත් මාධ්‍ය භාවිතයෙන් ජනතාව අතරට ගමන් කිරීමත් විශේෂිත වේ.

එසේම ලංකාදීප පුවත්පතට අමතරව 1949 වර්ෂයේ ආරම්භ කරන ලද "සිංහලේ" පුවත්පත ද, 1956 බණ්ඩාරනායක යුගය නිර්මාණය කිරීමටත් ජනතා සටන්වලදී විශාල කාර්යයක් ඉටුකර තිබේ. ඉංග්‍රීසි උගතුන්ගේ ඒකාධිකාරිය බිඳ දැමීමට හැකි බලවේගයක් ගොඩනැගීම අරමුණු කර ගනිමින් මෙම පුවත්පත් ක්‍රියාකර තිබේ. එසේම 1961 වර්ෂයේ දවස පුවත්පත හා එහි ඉරිදා පුවත්පත රිවිරැස පුවත්පත ආරම්භ වීමත් 60 දශකයේ ලංකාවේ පුවත්පත් සමාගම් ත්‍රිත්වයක් පැවතීමත්, (ටයිම්ස් / ලේක්හවුස් හා දවස යන ආයතන) 1964 රජය විසින් කොමිසමක් පත්කිරීමත් ඒ මඟින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමට උත්සාහ ගැනීමත් විශේෂ කොට සැලකිය හැකිය.

රාජ්‍ය අංශයේ බලපෑම දැඩිලෙස එල්ල වූ කාල වකවානුවක් ලෙස 70 දශකයෙන් පසු කාලය හඳුනා ගත හැකි අතර 1971 සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය විසින් ගෙන යනු ලැබූ ආවෘත ආර්ථික ප්‍රතිපත්තීන් ජනතාව අතරට ගෙන යාමට පුවත්පත් ක්‍රියාත්මක වී ඇති අතර 1973 වර්ෂයේ ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීම, පුවත්පත් විෂයයේ තීරණාත්මක වෙනස්කම් සිදුවීමක් ලෙස හඳුනාග ැනීමට හැකිය. එතැන් පටන් ලේක්හවුස් ආයතනය පළකරනු ලබන පුවත්පත් රජයට පක්ෂපාතී ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇත.

1977 වර්ෂයේ විවෘත ආර්ථිකය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් හරහා පුවත්පත් කලාව ද වෙනස්වීම්වලට ලක් වී ඇත. විවිධ විෂයයන් තේමා කර ගනිමින් ඒ ඒ විෂයන්ට අදාලව පුවත්පත් ආරම්භ කිරීමත් මේ කාලවකවානුව තුල දී හඳුනාගත හැකිය. එසේම ටයිම්ස් ආයතනය එම වර්ෂයේ දීම රජයට පවරා ගැනීමත් සිදුවිය. 1981 වර්ෂයේ උපාලි පුවත්පත් සමාගම ආරම්භ වීමත් ඉන් පළමුව "ඉරිදා දිවයින සංග්‍රහය" සහ "සන්ඩේ අයිලන්ඩ්" පුවත්පත් නිකුත් කිරීමත් 1982 සිට දිනපතා පුවත්පතක් ලෙස දිවයින හා දී අයිලන්ඩ් පුවත්පත් නිකුත් කිරීමත් ආරම්භ කර ඇත. එසේම ටයිම්ස් ආයතනය 1989 වර්ෂයේ වසා දැමීමත් , 88- 89 වර්ෂයේ ඇතිවූ තරුණ කැරැල්ල පිළිබඳව හා ඒ සඳහා රජය ක්‍රියාත්මක වූ ආකාරයත් දේශපාලනයට වඩා හිතකර ආකාරයෙන් ප්‍රවෘත්ති පළවීමත්, මහජනයාට හිතකර හා ප්‍රයෝජනවත් ප්‍රවෘත්ති පළ නොවීමත් හේතු කොට ගෙන විකල්ප ධාරාවේ පුවත්පත් බිහිවීම ද 80 - 90 යුගයේ විශේෂත්වයකි. වර්තමානයේ පවා ජනප්‍රිය "රාවය" පුවත්පත මෙලෙස ආරම්භ වූ විකල්ප පුවත්පතකි.

පුවත්පත් කලාවට මෙන්ම සමස්ත ශ්‍රී ලංකාවටම ආර්ථික, සමාජීය හා දේශපාලනික වශයෙන් පසුබෑමට ලක් කල වසර 30ක කාලයක් පැවති ත්‍රස්තවාදී අරගලය හේතුවෙන් 1989 සිට 2009 වර්ෂය දක්වාම පුවත්පත් අතර ප්‍රධාන තේමා ඒ හා සම්බන්ධිත කරුණු මඟින් පෝෂණය වී ඇති බවට හඳුනාග ැනීමට හැකිය. එමෙන්ම 2005 වර්ෂයේ සිදු වූ දේශපාලන හැරවීම් ලක්ෂය හා අනෙකුත් සාධක මත 2009 වර්ෂයේ ත්‍රස්තවාදී අරගලයේ නිමාව සටහන් වීමත් සමඟ සංවර්ධනයේ අරුණළු පුවත්පත් තුළින් ද ජනතාව අතරට ප්‍රවේශවීම පැහැදිලි ලෙසින්ම හඳුනා ගැනීමට හැකිවේ. 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රජය මඟින් ගෙන ගිය සංවර්ධන කටයුතු පිළිබඳව පුවත්පත් සාකච්ජා කළ අතර වර්තමාන 2020 වර්ෂය දක්වාම අඩු හා වැඩි වශයෙන් ආර්ථික, දේශපාලන, සමාජීය, අධ්‍යාපන, සෞඛ්‍ය, නීතිය , සංස්කෘතිය, කලාව , විද්‍යා හා තාක්ෂණ, සංචාරක යන ක්ෂේත්‍ර ඔස්සේ විවිධ විෂයය කරුණු මහජනතාව වෙත පුවත්පත් මඟින් ප්‍රවේශ කරනු ලබයි.

## 1.2 පර්යේෂණ පසුබිම

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් හඳුනාගත හැකි පුවත්පත් හා ඒවා මුද්‍රණය කරනු ලබන ආයතන, ආරම්භ කළ වර්ෂය හා එම පුවත්පත් දිනපතා හෝ සතිපතා සංසරණය වන ප්‍රමාණයන් පහත ආකාරයෙන් පෙන්වා දීමට හැකිවේ. ඒ අනුව දිනකදී වැඩිම සංසරණයක් සහිත පුවත්පත වන්නේ 1991 දී ආරම්භ කරන ලද ඉරිදා ලංකාදීප පුවත්පත වේ.

වගුව: 1. ශ්‍රී ලංකාවේ පුවත්පත් සංසරණය

| Newspaper | Language | Frequency | Publisher/ Parent Company | Established | Circulation |
|---|---|---|---|---|---|
| Ada | Sinhala | Daily | Wijeya Newspapers | 2012 | 110,000 |
| Daily Mirror | English | Daily | Wijeya Newspapers | 1999 | 76,000 |
| Ceylon Today | English | Daily | Ceylon Newspapers | 2011 | 25,000 |
| Daily News | English | Daily | Associated Newspapers of Ceylon | 1918 | 88,000 |
| Dinamina | Sinhala | Daily | Associated Newspapers of Ceylon | 1909 | 75,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| Divaina | Sinhala | Daily | Upali Newspapers | 1981 | 156,000 (Daily Divaina) 340,000 (Sunday Divaina) |
| The Island | English | Daily | Upali Newspapers | 1981 | 70,000 (Daily Island)<br>103,000 (Sunday Island) |
| Lakbima | Sinhala | Weekly | Sumathi Newspapers | 1994 | |
| Lakbima News | English | Weekly | Sumathi Newspapers | 2007 | |
| Lankadeepa | Sinhala | Daily | Wijeya Newspapers | 1991 | 250,000 (Daily Lankadeepa)<br>560,000 (Sunday Lankadeepa) |
| Mawbima | Sinhala | Weekly | Standard Newspapers | 2011 | |
| The Nation | English | Weekly | Rivira Media Corporation | 2006 | 132,000 |
| Ravaya | Sinhala | Weekly | Ravaya Publications | 1987 | |
| Resa | Sinhala | Weekly | Associated Newspapers of Ceylon | 2018 | |
| Rivira | Sinhala | Weekly | Rivira Media Corporation | 2006 | 265,000 |
| Silumina | Sinhala | Weekly | Associated Newspapers of Ceylon | 1930 | 265,000 |
| Sudar Oli | Tamil | Daily | Uthayan Group of Newspapers | 2000 | |
| The Sunday Leader | English | Weekly | Leader Publications | 1994 | |
| Sunday Observer | English | Weekly | Associated Newspapers of Ceylon | 1928 | 175,000 |
| The Sunday Times | English | Weekly | Wijeya Newspapers | 1991 | 330,000 |
| Thinakaran | Tamil | Daily | Associated Newspapers of Ceylon | 1932 | 50,000 (Thinakaran)<br>70,000 (Thinakaran Varamanjari) |
| Thinakkural | Tamil | Daily | Thinakkural Publications | 1997 | |
| Uthayan | Tamil | Daily | Uthayan Group of Newspapers | 1985 | |
| Virakesari | Tamil | Daily | Express Newspapers | 1930 | 140,000 |
| Randiwa | Sinhala | Weekly | Randiwa Newspapers | 2011 | |
| Sathhanda | Sinhala | Weekly | Sathhanda Publishers | 2015 | |
| Siyadesa | Sinhala | Weekly | Express Newspapers | 2017 | |

Source: https://en.wikipedia.org/wiki/List_of_newspapers_in_Sri_Lanka

තොරතුරු බෙදා හැරීමේ ප්‍රධාන ප්‍රභවය පුවත්පත් ය. නූතන සමාජයේ න්‍යාය පත්‍ර සකස් කරන්නන් ලෙස ඔවුන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. කාන්තාවන්, පරිසරය, දුප්පත්කම වැනි කරුණු පිළිබඳව ගැඹුරු දැක්මක් ලබා දෙමින් පුවත්පත් වල ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වේ. ප්‍රජාතන්ත්‍රවාදයේ එක් කුළුණක් ලෙස පුවත්පත් ජාතික සංවර්ධනයේ ඵලදායී කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රවෘත්ති බෙදා හැරීමේ වේගය, ශිල්පීය ක්‍රම සහ තොරතුරු බෙදාහැරීමේ ස්වභාවය වෙනස් වී ඇති නමුත් ප්‍රවෘත්ති සහ පුවත්පත්වල මූලික අරමුණ නියතව හා චිරස්ථායීව පවතී. තාක්ෂණයේ විප්ලවය, සමූහකරණය සහ ගෝලීයකරණය අන්තර්ගතයේ ස්වභාවය හා ප්‍රවෘත්ති බෙදා හැරීමේ පරමාදර්ශී වෙනසකට තුඩු දී තිබේ. මිනිසුන් තම එදිනෙදා තොරතුරු අවශ්‍යතා සඳහා පුවත්පත් මත යැපෙන හෙයින්, සමාජ ප්‍රශ්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට හා පුහුණු කිරීමට පුවත්පත් ක්‍රියා කළ යුතුය. සමාජ වගකීම් සහිත පුවත්පත් පුරවැසියන්ට ක්ෂණිකව සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳව හොඳින් දැනුවත් කිරීමට උපකාරී වේ. පුවත්පත් ප්‍රවෘත්ති වාර්තාකරණය හරහා මහජන මතය මතුවීමට සහ ප්‍රතිරූපය ගොඩනැගීමට අදහස් ප්‍රකාශ කිරීම, මහජනයා දැනුවත් කිරීම සහ එමඟින් වැදගත් කරුණු පිළිබඳ මහජන සාකච්ඡාවට පහසුකම් සැලසීම උපකාරී වේ.

- i. ජාතිය ගොඩනැගීමේ හා ජාතික සංවර්ධනයේ දී පුවත්පත් සහයෝගී භූමිකාවක් වෙනුවෙන් පෙනී සිටීම.
- ii. සමාජ හා දේශපාලන වෙනසක් සඳහා උත්ප්‍රේරකයක් ලෙස මාධ්‍යයේ කාර්යභාරය
- iii. මාධ්‍යයේ යුතුකම
- iv. හුදෙක් විනෝදාස්වාදය වෙනුවට අධ්‍යාපනය ලබා දීම .
- v. සමාජ ස්ථාවරත්වය සහ වාර්ගික සමගිය පවත්වා ගැනීම.
- vi. ආර්ථික සංවර්ධනයට සහ ජාතිය ගොඩනැගීමට ආධාර කිරීම.

වර්තමාන ශ්‍රී ලාංකික ජන සමාජය ගත්විට එහි අතීතයේ පැවති මානව ධර්මතා සියල්ලම පාහේ බිඳ වැටීමට ලක්වී ඇති බව පැහැදිලිවම හඳුනාගත හැකිය. එමෙන්ම විවිධාකාර වූ සමාජ ගැටලු රාශියකට වයස් භේදයකින් තොරව ජනතාව මුහුණ දී සිටී. ජනතාව පෙළ ගැස්වීමට හා ඒ ඔස්සේ මෙහෙයවීමට ක්ෂණික හැකියාවක් මාධ්‍ය සතු වේ. එකී සමාජ ගැටලු තුළින් ජනතාව ගලවා ගනිමින් නිවැරදි මාවතක් ඔස්සේ අනාගතය කරා රැගෙන යාමට මාධ්‍ය සතු වගකීම අතිමහත් වේ.

එමෙන්ම පවත්නා සමාජය කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ජනමාධ්‍ය සතුවේ. ඒ අතරින් පුවත්පතට අති විශේෂ ස්ථානයක් හිමිවේ. ජනමාධ්‍ය හා ජාතික සංවර්ධනය නමැති කෘතියේ ජනසන්නිවේදන මාධ්‍යයේ කාර්ය භාර්ය පිළිබඳ පැහැදිලි කරන විල්බර් ශ්‍රාම් පෙන්වා දෙන්නේ " බුද්ධිමත් සන්නිවේදන මාධ්‍යක් ලෙස පුවත්පත භාවිත කරන්නේ නම් එයින් ආර්ථික, සමාජ හා දේශපාලන කාරණා පුවත්පත මඟින් ඉටු කර ගත හැකි බවයි". සාක්ෂරතාව ඉතා ඉහළ අගයක් ගන්නා ශ්‍රී ලංකාවේ 90% කට වැඩි පිරිසකට කියවීමට හැකියාව පැවතීමත්, ජාතික පුවත්පත් ජනතාව අතර බහුල ලෙස පරිහරණය කිරීමත් හේතුවෙන් උක්ත කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රබල මාධ්‍යක් ලෙස පුවත්පත උපයෝගී කර ගත හැකිය.

එසේ වුව ද පුවත්පත මඟින් ලබා ගත හැකි ප්‍රතිලාභ උදෙසා වර්තමානයේ පුවත්පත් කලාව මෙහෙයවන්නේ ද යන ගැටළුව හඳුනාගත හැකිය. ප්‍රතිපත්ති සම්පාදනයේ සිටම එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන තෙක් ඔහු දැනුමෙන් හා ආකල්පයන්ගෙන් සන්නද්ධ කිරීමට පුවත්පත් කලාවට හැකියාව පැවතුන ද වර්තමානය වන විට හුදු වාණිජමය පරමාර්ථ මූලික කර ගනිමින් පුවත්පත් මුද්‍රණය වන බව ප්‍රකට කරුණකි. වටිනාකම් සහිත මාධ්‍ය කලාවක් ලෙස පුවත්පත වර්තමානය වන විට මානව සම්පත් සංවර්ධනය උදෙසා භාවිත කිරීම අනෙකුත් පරමාර්ථ අතර අප හමුවේ පවතින අභියෝගයකි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් 21ක් (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) වසර සියයක් තුළ දී මානව සම්පත් සංවර්ධනය කෙරෙහි කවර ආකාරයේ බලපෑමක් සිදු කර තිබේද ? යන ගැටළුවට විසඳුම් සෙවීම සඳහා කරුණු අධ්‍යනය කළ යුතුව ඇති බවට හඳුනාගත් අතර ඒ සඳහා "සියක් අවුරුදු අධ්‍යනයෙන්

2030 ට" - ශ්‍රී ලංකාවේ පුවත්පත් මානව සම්පත් සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය පිළිබඳව ජාතික සමීක්ෂණයක් සිදු කිරීම ආරම්භ කරන ලදී. වසර දෙසීයකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියනු ලබන ශ්‍රී ලංකාවේ පුවත්පත් මගින් පසුගිය වසර සියයක කාල පරාසය තුල මානව සම්පත් සංවර්ධනය උදෙසා කොපමණ අවකාශයක්, කුමන ආකාරයේ වැදගත්කමක් සහිතව ක්‍රියාත්මක වී තිබේද? මානව සම්පත දැනුවත් කිරීම සඳහා දායකත්වය සපයා තිබේද? එමගින් පාඨකයා දැනුවත්වී තිබේද? යන මූලික කරුණු පිළිබඳව පවතින්නේ ගැටලු සහගත බවකි. මෙකී ගැටලු සහගත බව පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණයක් සිදුකරමින් පුවත්පත් මඟින් මානව සම්පත් සංවර්ධනයට සිදු කර ඇති බලපෑම විශ්ලේෂණය කිරීම මෙහිදී සිදු කරනු ලැබීය.

මේ සඳහා ක්‍රමවේදයන් 03 ක් භාවිත කරනු ලැබිණි. ඒවා නම්,

1. වර්ෂ සියයක් තුළ ජාතික පුවත්පත් 21 ක පළ වූ ලිපි මඟින් අධ්‍යයනය කිරීම.
2. එම ලිපි සඳහා වෙන් කර ඇති අවකාශය පිළිබඳව අධ්‍යයනය කිරීම.
3. පාඨක මතය පිළිබඳ අධ්‍යයනය කිරීම.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන නිලධාරීන් 29 දෙනෙකු සහභාගී කර ගනිමින් ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් පුවත්පත් ලිපි හා ඒ සඳහා වෙන් වී ඇති අවකාශය පිළිබඳව තොරතුරු ලබා ගැනීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සිදු කිරීමත්, පාඨක මතය පිළිබඳ අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීම හා එය විශ්ලේෂණ කිරීමත් සිදු කරනු ලැබීය. මෙම සමීක්ෂණය 2020 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ 20 වන දින ආරම්භ කළ අතර එය 2020 දෙසැම්බර් 25 දින දක්වා සිදු කරනු ලැබිණි.

## 1.3 අරමුණු

1. ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කර එම දත්ත විශ්ලේෂණය මඟින් පුවත්පත් මානව සම්පත් සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය අනාවරණය කර ගැනීම.
2. පුද්ගල නියැදියක් මඟින් ඔවුන් එදිනෙදා තොරතුරු ලබා ගන්නා මාර්ග පිළිබඳව සමීක්ෂණයක් සිදුකර එමගින් පුවත්පත් පාඨකයින් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම, තොරතුරු ලබා ගැනීම සඳහා පුවත්පත් භාවිත නොකරන්නේ නම් එයට හේතු සහ තොරතුරු ලබා ගැනීමේ ජනප්‍රිය මාධ්‍යයක් බවට පුවත්පත පත්කිරීමට නව යෝජනා ලබා ගැනීම පිළිබඳව අධ්‍යනය කිරීම.
3. මානව සම්පත නිවැරදිව සංවර්ධනයට පුවත්පත් දායක කර ගත හැකි ආකාරය පිළිබඳ නිරීක්ෂණයන් හා නිගමනයන් ඉදිරිපත් කිරීම.
4. අවම වශයෙන් ජාතික පුවත්පත්වල මානව සම්පත් සංවර්ධනය සහ සමාජ සංවර්ධනය සඳහා වෙන් කර ඇති ඉඩ පවතින ප්‍රමාණයට වඩා ඉහළ නැංවීම රට තුළ ප්‍රතිපත්තියක් බවට පත් කර ගැනීම.
5. පාඨක ප්‍රජාව දැනුම්වත් කිරීම මඟින් බුද්ධිමත් හා තාර්කික ජන සමාජයක් බිහි කිරීම.
6. මානව ධර්මතා හා මානව ගුණාංග සහිත ශ්‍රී ලාංකිකයෙකු බිහි කිරීමට අවශ්‍ය පසුබිම සැකසීම.
7. ශ්‍රී ලාංකිකයින් අතර වඩාත් අවධානය දිනාගත් මාධ්‍යයක් බවට පුවත්පත පත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය මඟපෙන්වීම ලබා දීම



## 1.4 අධ්‍යයනයේ සීමාවන්

- කොවිඩ් වෛරසයෙහි දෙවන ක්‍රියාකාරී අවධිය හේතුවෙන් දත්ත රැස්කිරීමේදී ප්‍රතිපෝෂකයන් සහිතව සළකා බලනු ලබන සමීක්ෂණ වපසරිය ආවරණය කරගැනීමට අමතර කාලයක් ශ්‍රමයක් සහ වියදමක් දැරීමට සිදුවිය.

- පුවත්පත්වල පළවූ ලිපි පිළිබඳ තොරතුරු රැස්කිරීමේදී සීමිත සමීක්ෂකවරුන් සංඛ්‍යාවක් පමණකට සීමාවෙමින් කටයුතු කිරීමට සිදුවිය.
- යථෝක්ත තත්වය හේතුවෙන්ම වෛද්‍ය නිර්දේශයන්ට 100% අනුගතවන පරිදි දත්ත රැස්කිරීම සඳහා කටයුතු යොදා තිබූ බැවින් පාඨක සමීක්ෂණයෙහි නියැදිය 5010 ට සීමාවිය.

අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද පුවත්පත් තුළ පළවූ ලිපි අතරින් මානව සම්පත් සංවර්ධනය සඳහා ඍජු ලෙස සම්බන්ධතාවයක් දක්වනු ලබන ක්ෂේත්‍රයන්හි ලිපි පිළිබඳව තොරතුරු පහත වගු සටහන් මගින් පැහැදිලි කෙරේ.

වගුව 01. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය

| පුවත්පතේ නම | සංවර්ධනාත්මක තොරතුරු සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | අධ්‍යාපනය හා දර්ශනය සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | පවුල් සංස්ථාව හා බැඳුණු ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | ජීවන ක්‍රමය (Life Style) සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|
| අද | 20 | 1.7 | 41 | 3.4 | 0 | 0.0 | 10 | 1.7 |
| Ceylon Today | 59 | 5.0 | 49 | 4.1 | 37 | 13.2 | 44 | 7.4 |
| Daily News | 38 | 3.2 | 41 | 3.4 | 0 | 0.0 | 12 | 2.0 |
| Daily Mirror | 59 | 5.0 | 41 | 3.4 | 35 | 12.5 | 147 | 24.7 |
| දිනමිණ | 169 | 14.4 | 45 | 3.7 | 2 | 0.7 | 3 | 0.5 |
| දිනපතා ලංකාදීප | 36 | 3.1 | 64 | 5.3 | 42 | 14.9 | 36 | 6.0 |
| දිවයින | 22 | 1.9 | 17 | 1.4 | 11 | 3.9 | 4 | 0.7 |
| ලක්බිම | 18 | 1.5 | 33 | 2.7 | 10 | 3.6 | 17 | 2.9 |
| මව්බිම | 40 | 3.4 | 58 | 4.8 | 11 | 3.9 | 13 | 2.2 |
| රන්දිව | 19 | 1.6 | 65 | 5.4 | 3 | 1.1 | 6 | 1.0 |
| රාවය | 15 | 1.3 | 7 | 0.6 | 0 | 0.0 | 3 | 0.5 |
| රැස දිනපතා | 37 | 3.2 | 6 | 0.5 | 0 | 0.0 | 1 | 0.2 |
| සිළුමිණ | 60 | 5.1 | 32 | 2.7 | 23 | 8.2 | 36 | 6.0 |
| Sunday Observer | 58 | 5.0 | 227 | 18.9 | 33 | 11.7 | 38 | 6.4 |
| The Island | 74 | 6.3 | 64 | 5.3 | 15 | 5.3 | 93 | 15.6 |
| The Nation | 46 | 3.9 | 91 | 7.6 | 7 | 2.5 | 41 | 6.9 |
| Sunday Leader | 49 | 4.2 | 37 | 3.1 | 20 | 7.1 | 42 | 7.0 |
| Sunday Times | 138 | 11.8 | 90 | 7.5 | 8 | 2.8 | 7 | 1.2 |
| Thinakaran | 82 | 7.0 | 60 | 5.0 | 3 | 1.1 | 21 | 3.5 |
| Thinakural | 109 | 9.3 | 92 | 7.6 | 17 | 6.0 | 21 | 3.5 |
| Veerakesari | 22 | 1.9 | 44 | 3.7 | 4 | 1.4 | 1 | 0.2 |
| **එකතුව** | **1170** | **100** | **1204** | **100** | **281** | **100** | **596** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ඒ අනුව සංවර්ධනාත්මක තොරතුරු , අධ්‍යාපනය හා දර්ශනය, පවුල් සංස්ථාව හා බැඳුණු (කුටුම්භ) සහ ජීවන ක්‍රමය (Life Style) පිළිබඳව පුවත්පත් ලිපි අධ්‍යනයෙන් ලබාගත් දත්ත ඉහත 01 වගු සටහනේ දැක්වේ.

ඉහත දත්ත අනුව සැලකූ විට සංවර්ධනාත්මක තොරතුරු සහිත සමස්ත ලිපි 1170 අතරින් ,සිංහල මාධ්‍යය පුවත්පත් පළකර ඇති  ලිපි ප්‍රතිශතය 50% ක් පමණ වන අතර ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්හි මෙම ක්ෂේත්‍රය පිළිබඳව අවම ලිපි ප්‍රමාණයක් පළවී ඇත.

දෙමළ මාධ්‍ය පුවත්පත් මෙම ක්ෂේත්‍රය පිළිබඳව  පළ කර ඇති ලිපිවල  ප්‍රතිශතය 28 % ක් වන අතර එය සැලකිය යුතු ප්‍රතිශාත්මක අගයක් බව මෙම අධ්‍යනයෙන් හෙළිවිය.

සමස්තයක් ලෙස සැලකූ විට මෙම අධ්‍යනය සඳහා යොදාගත් පුවත්පත් අතරින් සංවර්ධනාත්මක ලිපි පළ කිරීමේ දී ඒවාට හිමිවී ඇත්තේ 2% -8% අතර ඉතා පහළ අගයක් බව නිරීක්ෂණය විය.

එමෙන්ම මානව සම්පත් සංවර්ධනය සඳහා සෘජුවම බලපෑම් කරනු ලබන අධ්‍යාපනය හා දර්ශනය, පවුල් සංස්ථාව හා බැඳුණු (කුටුම්භ) සහ ජීවන ක්‍රමය (Life Style) යන ක්ෂේත්‍රයන් සඳහා ද ඉඩකඩ වෙන් කර ඇත්තේ ඉතා අවම ප්‍රමාණයකින් බව මෙම අධ්‍යනයේ දී හෙළිවිය.

අධ්‍යාපනය හා දර්ශනය සම්බන්ධ ලිපි 1204 අතරින් ලිපි 640 ක් පළකර කරමින් ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් 53.1 % ප්‍රතිශතයක් ලබා දී ඇති අතර, අනෙකුත් පුවත්පත් 0.5% සිට 7.6% දක්වා වන පරාසයක ප්‍රතිශතයන් දක්වා ඇති බව මෙහිදී තවදුරටත් නිරීක්ෂණය විය.

පවුල් සංස්ථාව හා බැඳුණු (කුටුම්භ) සම්බන්ධිත ලිපි 281 මෙම අධ්‍යනය තුළින් හමු වූ අතර ඉන් ලිපි 102 ක් පළකර ඇත්තේ සිංහල මාධ්‍යය  පුවත්පත්වල වේ. එහි සමස්ත ප්‍රතිශතය 50 % ප්‍රමාණයකට ආසන්න වුවද සමහර සිංහල මාධ්‍යය  පුවත්පත්වල මෙම ක්ෂේත්‍රයට අදාලව ලිපි පළවී ඇත්තේ ඉතා අවම ප්‍රමාණයක් බවත්, ඉංග්‍රීසි මාධ්‍යය  පුවත්පත් 70 % වඩා වැඩි  ප්‍රතිශතයක් වෙන් කර ඇති බවත්, දෙමළ මාධ්‍යය පුවත්පත් 10%ක පමණ ප්‍රතිශතයක් ජීවන ක්‍රමය (Life Style) පිළිබඳ ලිපි සඳහා වෙන්කර ඇති අතර සිංහල මාධ්‍යය පුවත්පත් මෙම ක්ෂේත්‍රය පිළිබඳව සැලකිය යුතු අවකාශයක් වෙන් කර නොමැති බව මෙම අධ්‍යනය මඟින් පැහැදිලි විය.

මානව සම්පත් සංවර්ධනය සඳහා සෘජු ලෙස සම්බන්ධතාවයක් දක්වනු ලබන ආහාර හා ආහාර පුරුදු, සෞඛ්‍ය හා සෞඛ්‍ය පුරුදු, ඉතිහාසය හා උරුමයන්, කලාව හා රසවින්දනය සහ විශේෂාංග ලිපි යන ක්ෂේත්‍රයන්  පිළිබඳ මෙම අධ්‍යනයේ දී හඳුනාගත් දත්ත පහත වගු සටහන 02 මඟින් පෙන්වා දී ඇත.

**වගුව 02. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | ආහාර හා ආහාර සංස්කෘතිය සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | සෞඛ්‍ය හා පුරුදු සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | ඉතිහාසය හා උරුමයන් ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | කලාව හා රසවින්දනය සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | විනෝදාංශ ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අද | 8 | 2.4 | 39 | 5.6 | 5 | 1.4 | 51 | 2.9 | 22 | 2.6 |
| Ceylon Today | 19 | 5.8 | 43 | 6.2 | 16 | 4.6 | 100 | 5.8 | 63 | 7.4 |
| Daily News | 15 | 4.6 | 59 | 8.5 | 3 | 0.9 | 34 | 2.0 | 12 | 1.4 |
| Daily Mirror | 51 | 15.5 | 13 | 1.9 | 39 | 11.2 | 108 | 6.2 | 46 | 5.4 |
| දිනමිණ | 6 | 1.8 | 68 | 9.8 | 7 | 2.0 | 122 | 7.0 | 32 | 3.8 |
| දිනපතා ලංකාදීප | 19 | 5.8 | 47 | 6.8 | 8 | 2.3 | 73 | 4.2 | 92 | 10.8 |
| දිවයින | 1 | 0.3 | 5 | 0.7 | 24 | 6.9 | 7 | 0.4 | 26 | 3.1 |
| ලක්බිම | 14 | 4.3 | 20 | 2.9 | 18 | 5.2 | 64 | 3.7 | 64 | 7.5 |
| මව්බිම | 8 | 2.4 | 43 | 6.2 | 38 | 11.0 | 28 | 1.6 | 40 | 4.7 |
| රන්දිව | 9 | 2.7 | 16 | 2.3 | 9 | 2.6 | 73 | 4.2 | 7 | 0.8 |
| රාවය | 1 | 0.3 | 8 | 1.2 | 4 | 1.2 | 23 | 1.3 | 48 | 5.6 |
| රැස දිනපතා | 2 | 0.6 | 6 | 0.9 | 1 | 0.3 | 21 | 1.2 | 41 | 4.8 |
| සිළුමිණ | 15 | 4.6 | 40 | 5.8 | 25 | 7.2 | 230 | 13.3 | 42 | 4.9 |
| Sunday Observer | 42 | 12.8 | 68 | 9.8 | 40 | 11.5 | 252 | 14.5 | 70 | 8.2 |
| The Island | 21 | 6.4 | 41 | 5.9 | 41 | 11.8 | 156 | 9.0 | 35 | 4.1 |
| The Nation | 7 | 2.1 | 29 | 4.2 | 23 | 6.6 | 158 | 9.1 | 73 | 8.6 |
| Sunday Leader | 22 | 6.7 | 26 | 3.7 | 25 | 7.2 | 69 | 4.0 | 76 | 8.9 |
| Sunday Times | 10 | 3.0 | 11 | 1.6 | 3 | 0.9 | 34 | 2.0 | 13 | 1.5 |
| Thinakaran | 23 | 7.0 | 44 | 6.3 | 10 | 2.9 | 88 | 5.1 | 14 | 1.6 |
| Thinakural | 22 | 6.7 | 43 | 6.2 | 7 | 2.0 | 19 | 1.1 | 26 | 3.1 |
| Veerakesari | 13 | 4.0 | 25 | 3.6 | 1 | 0.3 | 23 | 1.3 | 8 | 0.9 |
| එකතුව | **328** | **100** | **694** | **100** | **347** | **100** | **1733** | **100** | **850** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

මෙම ක්ෂේත්‍ර පිළිබඳව පුවත්පත්වල පළ වූ සහ ඒ සඳහා වෙන්කරන ලද අවකාශයන් පිළිබඳව අධ්‍යනයේ දී ආහාර හා ආහාර පුරුදු, සෞඛ්‍ය හා සෞඛ්‍ය පුරුදු, ඉතිහාසය හා උරුමයන් යන තේමාවන් ඔස්සේ ලිපි පළ කිරීම සම්බන්ධයෙන් පුවත්පත්වල අවධානය අඩු මට්ටමක පවතින බව පෙන්වා දිය හැකිය.

අධ්‍යනය සඳහා තෝරාගන්නා ලද පුවත්පත් අතර ආහාර හා ආහාර පුරුදු සම්බන්ධයෙන් වන ලිපි 328ක් ද, සෞඛ්‍ය හා සෞඛ්‍ය පුරුදු පිළිබඳව සඳහන් වන ලිපි 694 ක් තිබූ අතර පුවත්පත ආහාර සම්බන්ධවන ලිපි ප්‍රතිශතයෙන් අවම බර තැබීමක් හා අවකාශයක් වෙන්කර ඇත්තේ සිංහල මාධ්‍යය

පුවත්පත් බවත්, ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් සමස්තයක් ලෙස වඩා වැඩි ප්‍රතිශතයන් හා දෙමළ මාධ්‍යය පුවත්පත් ලිපි ප්‍රමාණයට සාපේක්ෂව සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇති ඉහත දත්ත මඟින් පැහැදිලි වේ.

සෞඛ්‍ය හා සෞඛ්‍ය පුරුදු පිළිබඳව ලිපි අධ්‍යයනයේ දී සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් සමාන දායකත්වයක් දක්වා ඇති බව හඳුනාගැනීමට හැකි විය. එමෙන්ම පුවත්පත් වැඩි සංඛ්‍යාවක යම්තාක් දුරකට සැලකිය හැකි ලිපි සහ අවකාශයක් වෙන් කර තිබූ බව මෙම දත්ත මඟින් පෙන්වා දිය හැකිය. ඉතිහාසය හා උරුමයන් පිළිබඳව සියලුම පුවත්පත් ඉතා අවම අවධානයක් යොමු කර ඇති අතර එය මුළු පුවත්පත ලිපි ප්‍රමාණයෙන් ලිපි 347 කි. මෙහි නිරීක්ෂණය කළ හැකි තවත් ලක්ෂණයක් වන්නේ ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් ත්‍රිත්වයක මේ සම්බන්ධ ලිපි 40 කට ආසන්න ප්‍රමාණයක් පැවතිය ද සිංහල මාධ්‍යය පුවත්පත් කිහිපයක් හැරුණ විට සිංහල හා දෙමළ මාධ්‍යය පුවත්පත් මෙම විෂයය සඳහා දක්වා ඇත්තේ අවම අවධානයක් බව මෙම අධ්‍යනයේ දී පැහැදිලි විය.

කලාව හා රසවින්දනය ලිපි පිළිබඳ අධ්‍යනයේ දී ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් ලිපි 911 ක් හා 52% ප්‍රතිශතයක් හා සිංහල මාධ්‍ය පුවත්පත් ලිපි 662 ක් හා 38% ප්‍රතිශතයක් දක්වා ඇති අතර ඉතිරි 10% ප්‍රතිශතය දෙමළ මාධ්‍යය පුවත්පත් සඳහා ද වෙන්වී ඇති බව මෙහිදී හඳුනා ගැනීමට හැකි විය.

විශේෂාංග ලිපි පළ කිරීමේ දී අධ්‍යයනයෙන් හමු වූ ලිපි 850 අතරින් 414 ක් සිංහල මාධ්‍යය වන අතර 388ක් ඉංග්‍රීසි මාධ්‍යය වේ. සමස්තයක් ලෙස සෑම පුවත්පතක්ම මෙම ක්ෂේත්‍රය සඳහා හඳුනාගත හැකි අවස්ථාවන් ලබා දී තිබූ බව ඉහත වගු සටහන අනුව පැහැදිලි වේ.

මානව සම්පත් සංවර්ධනය සඳහා සෘජු සම්බන්ධතාවයක් දක්වනු ලබන ක්ෂේත්‍රයන් පිළිබඳ මෙම අධ්‍යනයේ දී හඳුනාගත් නිරීක්ෂණයන් පහත වගු සටහන 02 මඟින් පෙන්වා දී ඇත.

**වගුව 03. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | පරිසරය ආශ්‍රිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ලිපි ප්‍රතිශතය % | වෙළෙඳදැන්වීම ගණන | මුළු ලිපි ගණනින් එම ලිපි ප්‍රතිශතය % | පර්යේෂණ තොරතුරු ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ලිපි ප්‍රතිශතය % | දේශපාලනික ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ලිපි ප්‍රතිශතය % | අපරාධ සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ලිපි ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අද | 13 | 2.7 | 106 | 0.9 | 0 | 0.0 | 100 | 3.6 | 8 | 0.8 |
| Ceylon Today | 46 | 9.4 | 72 | 0.6 | 0 | 0.0 | 78 | 2.8 | 49 | 4.7 |
| Daily News | 90 | 18.4 | 463 | 3.9 | 6 | 4.6 | 108 | 3.9 | 49 | 4.7 |
| Daily Mirror | 45 | 9.2 | 466 | 4.0 | 0 | 0.0 | 147 | 5.4 | 0 | 0.0 |
| දිනමිණ | 22 | 4.5 | 1129 | 9.6 | 11 | 8.4 | 295 | 10.7 | 136 | 13.0 |
| දිනපතා ලංකාදීප | 28 | 5.7 | 468 | 4.0 | 4 | 3.1 | 93 | 3.4 | 114 | 10.9 |
| දිවයින | 21 | 4.3 | 199 | 1.7 | 7 | 5.3 | 62 | 2.3 | 40 | 3.8 |
| ලක්බිම | 8 | 1.6 | 214 | 1.8 | 4 | 3.1 | 113 | 4.1 | 30 | 2.9 |
| මව්බිම | 9 | 1.8 | 222 | 1.9 | 24 | 18.3 | 104 | 3.8 | 24 | 2.3 |
| රන්දිව | 5 | 1.0 | 51 | 0.4 | 2 | 1.5 | 47 | 1.7 | 11 | 1.1 |
| රාවය | 2 | 0.4 | 11 | 0.1 | 24 | 18.3 | 108 | 3.9 | 2 | 0.2 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රැස දිනපතා | 2 | 0.4 | 5 | 0.0 | 0 | 0.0 | 42 | 1.5 | 8 | 0.8 |
| සිළුමිණ | 15 | 3.1 | 898 | 7.6 | 9 | 6.9 | 90 | 3.3 | 28 | 2.7 |
| Sunday Observer | 32 | 6.5 | 4647 | 39.5 | 14 | 10.7 | 96 | 3.5 | 25 | 2.4 |
| The Island | 45 | 9.2 | 331 | 2.8 | 0 | 0.0 | 183 | 6.7 | 22 | 2.1 |
| The Nation | 21 | 4.3 | 132 | 1.1 | 0 | 0.0 | 97 | 3.5 | 36 | 3.4 |
| Sunday Leader | 26 | 5.3 | 303 | 2.6 | 0 | 0.0 | 180 | 6.6 | 0 | 0.0 |
| Sunday Times | 13 | 2.7 | 739 | 6.3 | 0 | 0.0 | 55 | 2.0 | 9 | 0.9 |
| Thinakaran | 6 | 1.2 | 242 | 2.1 | 18 | 13.7 | 182 | 6.6 | 55 | 5.3 |
| Thinakural | 40 | 8.2 | 338 | 2.9 | 3 | 2.3 | 328 | 11.9 | 255 | 24.4 |
| Veerakesari | 1 | 0.2 | 735 | 6.2 | 5 | 3.8 | 238 | 8.7 | 146 | 13.9 |
| **එකතුව** | **490** | **100** | **11771** | **100** | **131** | **100** | **2746** | **100** | **1047** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

දේශපාලනය හා සම්බන්ධිත තොරතුරු සහිත ලිපි පළකිරීමේ දී සමස්ත ලිපි ප්‍රමාණයෙන් 7.4% ප්‍රතිශතයක් අධ්‍යයනය සඳහා යොදාගත් පුවත්පත් වෙන්කර ඇති අතර සෑම මාධ්‍යයක්ම මෙ සම්බන්ධව තම පුවත්පත් තුළ අවම ලිපි 47 ක් හා උපරිම ලිපි 295ක් වන පරාසයක් තුළ ඉඩකඩ වෙන්කර ඇති බව ඉහත වගු සටහන් මගින් පෙන්වා දිය හැකිය. පුවත්පත්වල අපරාධ හා සම්බන්ධ ලිපි පළ කිරීමේ දී එය සමස්ත ලිපි ප්‍රමාණයෙන් 2.82% ප්‍රතිශතයක් වේ. පුවත්පත් වශයෙන් ගත් විට දෙමළ මාධ්‍යය පුවත්පත් වල අපරාධ සම්බන්ධ ලිපි පළකිරීමේ වැඩි

නැඹුරුතාවයක් නිරීක්ෂණය කළ හැකි වේ.සිංහල මාධ්‍යය පුවත්පත් සැලකුවිට දිනපතා පුවත්පත්වල මේ සඳහා වැඩි අවකාශයක් ලබා දී ඇති බව පැහැදිලි වේ.

## වගුව 04. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය

| පුවත්පතේ නම | සංස්කෘතිය සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | රජයේ දැන්වීම ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | ප්‍රාදේශීය පුවත් ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | ක්‍රීඩා ආශ්‍රිත සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | ව්‍යාපාර ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අද | 0 | 0.0 | 11 | 0.9 | 140 | 7.4 | 88 | 4.0 | 33 | 1.8 |
| Ceylon Today | 1 | 0.3 | 0 | 0.0 | 45 | 2.4 | 161 | 7.3 | 146 | 7.7 |
| Daily News | 8 | 2.1 | 341 | 27.1 | 5 | 0.3 | 229 | 10.4 | 61 | 3.2 |
| Daily Mirror | 0 | 0.0 | 0 | 0.0 | 117 | 6.2 | 160 | 7.3 | 265 | 14.1 |
| දිනමිණ | 108 | 28.3 | 365 | 29.0 | 375 | 19.8 | 97 | 4.4 | 28 | 1.5 |
| දිනපතා ලංකාදීප | 24 | 6.3 | 25 | 2.0 | 85 | 4.5 | 90 | 4.1 | 65 | 3.5 |
| දිවයින | 14 | 3.7 | 98 | 7.8 | 111 | 5.9 | 46 | 2.1 | 33 | 1.8 |
| ලක්බිම | 2 | 0.5 | 10 | 0.8 | 15 | 0.8 | 47 | 2.1 | 58 | 3.1 |
| මව්බිම | 18 | 4.7 | 6 | 0.5 | 42 | 2.2 | 17 | 0.8 | 38 | 2.0 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රන්දිව | 10 | 2.6 | 5 | 0.4 | 50 | 2.6 | 34 | 1.5 | 45 | 2.4 |
| රාවය | 4 | 1.0 | 2 | 0.2 | 13 | 0.7 | 13 | 0.6 | 9 | 0.5 |
| රුස දිනපතා | 4 | 1.0 | 1 | 0.1 | 9 | 0.5 | 44 | 2.0 | 5 | 0.3 |
| සිළුමිණ | 40 | 10.5 | 29 | 2.3 | 40 | 2.1 | 37 | 1.7 | 73 | 3.9 |
| Sunday Observer | 63 | 16.5 | 196 | 15.6 | 75 | 4.0 | 256 | 11.7 | 139 | 7.4 |
| The Island | 0 | 0.0 | 0 | 0.0 | 43 | 2.3 | 194 | 8.8 | 219 | 11.6 |
| The Nation | 0 | 0.0 | 0 | 0.0 | 110 | 5.8 | 199 | 9.1 | 179 | 9.5 |
| Sunday Leader | 0 | 0.0 | 0 | 0.0 | 103 | 5.4 | 140 | 6.4 | 246 | 13.1 |
| Sunday Times | 0 | 0.0 | 0 | 0.0 | 50 | 2.6 | 122 | 5.6 | 138 | 7.3 |
| Thinakaran | 16 | 4.2 | 87 | 6.9 | 153 | 8.1 | 60 | 2.7 | 10 | 0.5 |
| Thinakural | 32 | 8.4 | 48 | 3.8 | 200 | 10.6 | 89 | 4.1 | 75 | 4.0 |
| Veerakesari | 37 | 9.7 | 33 | 2.6 | 112 | 5.9 | 73 | 3.3 | 19 | 1.0 |
| **එකතුව** | **381** | **100** | **1257** | **100** | **1892** | **100** | **2196** | **100** | **1884** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

රජයේ දැන්වීම් පළ කිරීමේ දී සිංහල මාධ්‍යය පුවත්පත් ඒ සඳහා වැඩි අවකාශයක් වෙන් කර ඇති අතර ඒ අතරින් ද රාජ්‍ය පුවත්පත් ප්‍රමුඛතාවය ගෙන ඇති බව පෙන්වාදීමට පුළුවන. එමෙන්ම දෙමළ මාධ්‍යය පුවත්පත් ඉංග්‍රීසි පුවත්පත්වලට වඩා වැඩි ප්‍රමාණයක් මේ සඳහා වෙන් කර ඇති බව හඳුනාග ැනීමට හැකිවේ. ක්‍රීඩාව හා සම්බන්ධිත ලිපි පළ කිරීමේ දී එම ලිපි ප්‍රමාණය 2196 ක් වන අතර ඉන් ඉංග්‍රීසි පුවත්පත් 50% වඩා වැඩි ප්‍රතිශතයක් හිමි කරගෙන ඇත. එයට සාපේක්ෂව සිංහල පුවත්පත් ලිපි 13 - 97 දක්වා වන පරාසයන්හි ලිපි පළ කර ඇති බව අධ්‍යයනයෙන්

හෙළිවිය. ව්‍යාපාර සම්බන්ධයෙන් හා ප්‍රාදේශීය ප්‍රවෘත්ති පිළිබඳව ලිපි පළ කිරීමේ දී 5.1% - 5% ක් ලෙස එය සමස්ත ලිපි ප්‍රමාණයෙන් වෙන්කර හඳුනාගැනීමට හැකිවේ.

මානව සම්පත් සංවර්ධනය සඳහා වක්‍ර සම්බන්ධතාවයක් දක්වනු ලබන ක්ෂේත්‍රයන් පිළිබඳ මෙම අධ්‍යනයේ දී හඳුනාගත් නිරීක්ෂණයන් පහත වගු සටහන 02 මගින් පෙන්වා දී ඇත.

**වගුව 05. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | නෛතික පසුබිමසහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | සමාජ ගැටළු සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | පරිගණක හා තොරතුරු ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | සංචාරක (දේශීය/විදේශ) සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | ඕපාදූප සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අද | 12 | 1.0 | 10 | 1.2 | 2 | 0.9 | 3 | 0.5 | 6 | 1.4 |
| Ceylon Today | 46 | 3.9 | 7 | 0.9 | 39 | 18.4 | 132 | 19.8 | 0 | 0.0 |
| Daily News | 130 | 11.1 | 23 | 2.9 | 2 | 0.9 | 7 | 1.1 | 6 | 1.4 |
| Daily Mirror | 108 | 9.2 | 0 | 0.0 | 17 | 8.0 | 27 | 4.1 | 0 | 0.0 |
| දිනමිණ | 55 | 4.7 | 69 | 8.6 | 4 | 1.9 | 77 | 11.6 | 50 | 11.5 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිනපතා ලංකාදීප | 82 | 7.0 | 150 | 18.6 | 4 | 1.9 | 53 | 8.0 | 65 | 14.9 |
| දිවයින | 47 | 4.0 | 31 | 3.8 | 4 | 1.9 | 37 | 5.6 | 42 | 9.7 |
| ලක්බිම | 24 | 2.0 | 31 | 3.8 | 5 | 2.4 | 69 | 10.4 | 50 | 11.5 |
| මව්බිම | 58 | 4.9 | 68 | 8.4 | 7 | 3.3 | 20 | 3.0 | 7 | 1.6 |
| රන්දිව | 20 | 1.7 | 10 | 1.2 | 2 | 0.9 | 14 | 2.1 | 18 | 4.1 |
| රාවය | 58 | 4.9 | 35 | 4.3 | 1 | 0.5 | 8 | 1.2 | 0 | 0.0 |
| රස දිනපතා | 12 | 1.0 | 14 | 1.7 | 3 | 1.4 | 6 | 0.9 | 4 | 0.9 |
| සිළුමිණ | 28 | 2.4 | 54 | 6.7 | 16 | 7.5 | 26 | 3.9 | 15 | 3.4 |
| Sunday Observer | 52 | 4.4 | 83 | 10.3 | 17 | 8.0 | 50 | 7.5 | 99 | 22.8 |
| The Island | 169 | 14.4 | 0 | 0.0 | 9 | 4.2 | 28 | 4.2 | 0 | 0.0 |
| The Nation | 0 | 0.0 | 0 | 0.0 | 34 | 16.0 | 14 | 2.1 | 0 | 0.0 |
| Sunday Leader | 59 | 5.0 | 0 | 0.0 | 11 | 5.2 | 47 | 7.1 | 0 | 0.0 |
| Sunday Times | 18 | 1.5 | 8 | 1.0 | 3 | 1.4 | 4 | 0.6 | 0 | 0.0 |
| Thinakaran | 31 | 2.6 | 32 | 4.0 | 18 | 8.5 | 30 | 4.5 | 64 | 14.7 |
| Thinakural | 116 | 9.9 | 132 | 16.4 | 14 | 6.6 | 10 | 1.5 | 4 | 0.9 |
| Veerakesari | 49 | 4.2 | 49 | 6.1 | 0 | 0.0 | 3 | 0.5 | 5 | 1.1 |
| **එකතුව** | **1174** | **100** | **806** | **100** | **212** | **100** | **665** | **100** | **435** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

නීතිය හා ඒ ආශ්‍රිතව ලිපි පුවත්පත්වල පළ කිරීමේ දී ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත් වැඩි වශයෙනුත් සිංහල මාධ්‍යය පුවත්පත් අනෙක් පුවත්පත් ලිපිවලට සාපේක්ෂව සාමාන්‍ය ප්‍රමාණයකින් ලිපි පළකිරීමත් සිදු කර ඇත. අධ්‍යනය සඳහා යොදාගත් සමස්ත ලිපි ප්‍රමාණයෙන් එය ප්‍රතිශතයන් ලෙස දැක්වූ විට 3.1% ප්‍රමාණයකි.

සමාජ ගැටලු පිළිබඳව ලිපි පළ කිරීමේ දී සිංහල මාධ්‍යය පුවත්පත් ඉදිරියෙන් සිටින අතර ඉංග්‍රීසි මාධ්‍යය පුවත්පත්වලට සාපේක්ෂව දෙමළ මාධ්‍යය පුවත්පත් වැඩි වශයෙන් සමාජ ගැටලු සම්බන්ධව ලිපි කර ඇතිබව මෙම අධ්‍යනයෙන් හෙළිවිය. පරිගණක තාක්ෂණය සම්බන්ධිත තොරතුරු, සංචාරක, ඕපාදූප, පරිසරය, පර්යේෂණ තොරතුරු, සාහිත්‍යය හා ශාස්ත්‍රීය ලිපි සම්බන්ධව මාධ්‍යය ත්‍රිත්වයෙන්ම තෝරාගනු ලැබූ පුවත්පත් අවම ලිපි ප්‍රමාණයක් හා අවකාශයක් වෙනකර ඇති බව මෙහිදී නිරීක්ෂණය විය.

**වගුව 06. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | තරුණයින් කේන්ද්‍ර කරගත් සහිත ලිපි | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | නිවාස හා ගෙවතු සහිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | පතපොත ආශ්‍රිත ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | විලාසිතා හා සැරසිලි ලිපි ගණන | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % | විද්‍යාව හා තාක්ෂණය ලිපි | මුළු ලිපි ගණනින් එම ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අද | 3 | 0.9 | 1 | 0.1 | 1 | 0.4 | 3 | 1.5 | 19 | 9.1 |
| Ceylon Today | 5 | 1.6 | 2 | 0.1 | 12 | 4.6 | 10 | 5 | 2 | 1.0 |
| Daily News | 10 | 3.2 | 1 | 0.1 | 4 | 1.5 | 7 | 3.5 | 9 | 4.3 |
| Daily Mirror | 18 | 5.7 | 1 | 0.1 | 2 | 0.8 | 8 | 4 | 26 | 12.4 |
| දිනමිණ | 8 | 2.5 | 2 | 0.1 | 16 | 6.2 | 4 | 2 | 8 | 3.8 |
| දිනපතා ලංකාදීප | 12 | 3.8 | 21 | 1.3 | 24 | 9.2 | 2 | 1 | 2 | 1.0 |
| දිවයින | 11 | 3.5 | 5 | 0.3 | 6 | 2.3 | 0 | 0 | 8 | 3.8 |
| ලක්බිම | 5 | 1.6 | 13 | 0.8 | 7 | 2.7 | 4 | 2 | 9 | 4.3 |
| මව්බිම | 16 | 5.0 | 5 | 0.3 | 20 | 7.7 | 1 | 0.5 | 8 | 3.8 |
| රන්දිව | 8 | 2.5 | 0 | 0.0 | 1 | 0.4 | 6 | 3 | 2 | 1.0 |
| රාවය | 2 | 0.6 | 0 | 0.0 | 7 | 2.7 | 0 | 0 | 3 | 1.4 |
| රුස දිනපතා | 1 | 0.3 | 0 | 0.0 | 2 | 0.8 | 0 | 0 | 7 | 3.3 |
| සිළුමිණ | 35 | 11.0 | 18 | 1.1 | 38 | 14.6 | 28 | 14 | 15 | 7.2 |
| Sunday Observer | 75 | 23.7 | 1513 | 91.7 | 58 | 22.3 | 74 | 37 | 35 | 16.7 |
| The Island | 9 | 2.8 | 9 | 0.5 | 4 | 1.5 | 15 | 7.5 | 0 | 0.0 |
| The Nation | 9 | 2.8 | 4 | 0.2 | 16 | 6.2 | 6 | 3 | 12 | 5.7 |
| Sunday Leader | 34 | 10.7 | 9 | 0.5 | 12 | 4.6 | 22 | 11 | 0 | 0.0 |
| Sunday Times | 16 | 5.0 | 6 | 0.4 | 3 | 1.2 | 9 | 4.5 | 0 | 0.0 |
| Thinakaran | 10 | 3.2 | 6 | 0.4 | 5 | 1.9 | 0 | 0 | 7 | 3.3 |
| Thinakural | 23 | 7.3 | 18 | 1.1 | 9 | 3.5 | 1 | 0.5 | 33 | 15.8 |
| Veerakesari | 7 | 2.2 | 16 | 1.0 | 13 | 5.0 | 0 | 0 | 4 | 1.9 |
| **එකතුව** | 317 | 100 | 1650 | 100 | 260 | 100 | 200 | 100 | 209 | 100 |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ඉහත දත්ත සටහන අනුව තරුණයන් කේන්ද්‍ර කර ගත් ලිපි, නිවාස හා ගෙවතු ආශ්‍රිත ලිපි, පතපොත, විලාසිතා සහ විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍ර පිළිබඳව පුවත්පත්වල ලිපි පළ කිරීම සම්බන්ධයෙන් අධ්‍යනය කළ විට නිවාස හා ගෙවතු ආශ්‍රිත ලිපි හැර ඉතිරි ක්ෂේත්‍ර සඳහා තෝරාගන්නා ලද පුවත්පත් තුළ වැඩි අවකාශයක් හා අවස්ථාවන් ලබා දී නොමැති බව පැහැදිලි වේ.

මානව සම්පත් සංවර්ධනය සඳහා සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි වෙනත් ක්ෂේත්‍රයන් පිළිබඳ මෙම අධ්‍යනයේ දී හඳුනාගත් නිරීක්ෂණයන් පහත වගු සටහන් මඟින් පෙන්වා දී ඇත.

**වගුව 07. පුවත්පත්වල තොරතුරු අන්තර්ගතය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | ශාසුත්‍රීය ලිපි ගණන | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % | මුළු එකතුව | මුළු ලිපි ගණනින් එහි ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| අද | 1 | 0.2 | 756 | 2.0 |
| Ceylon Today | 0 | 0.0 | 1231 | 3.3 |
| Daily News | 5 | 1.0 | 1772 | 4.8 |
| Daily Mirror | 0 | 0.0 | 1889 | 5.1 |
| දිනමිණ | 19 | 3.7 | 3331 | 9.0 |
| දිනපතා ලංකාදීප | 15 | 3.0 | 1843 | 5.0 |
| දිවයින | 25 | 4.9 | 964 | 2.6 |
| ලක්බිම | 29 | 5.7 | 1005 | 2.7 |
| මව්බිම | 27 | 5.3 | 1020 | 2.8 |
| රන්දිව | 3 | 0.6 | 551 | 1.5 |
| රාවය | 21 | 4.1 | 432 | 1.2 |
| රැස දිනපතා | 6 | 1.2 | 290 | 0.8 |
| සිළුමිණ | 148 | 29.2 | 2183 | 5.9 |
| Sunday Observer | 32 | 6.3 | 8459 | 22.9 |
| The Island | 27 | 5.3 | 1773 | 4.8 |
| The Nation | 0 | 0.0 | 1298 | 3.5 |
| Sunday Leader | 58 | 11.4 | 1567 | 4.2 |
| Sunday Times | 20 | 3.9 | 1389 | 3.8 |
| Thinakaran | 35 | 6.9 | 1412 | 3.8 |
| Thinakural | 24 | 4.7 | 2148 | 5.8 |
| Veerakesari | 12 | 2.4 | 1698 | 4.6 |
| එකතුව | **507** | **100** | **37011** | **100** |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත, 2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

පුවත්පත් ලිපි අතර අධ්‍යනය අනුව වැඩිම ප්‍රමාණයක් හමුවන්නේ වෙළඳ දැන්වීම් හා සම්බන්ධ ලිපි වේ. එම ප්‍රමාණය 11771 කි. මාධ්‍යය ත්‍රිතිවයේම දිනපතා පුවත්පත් මෙන්ම සති අන්ත පුවත්පත් ද මේ සම්බන්ධව වැඩි අවකාශයක් ලබා දී ඇත. එයින් ද ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බව පැහැදිලිවම නිරීක්ෂණය කළහැකි වේ.

**වගුව 08 - ජාතික පුවත්පත් මානව සංවර්ධනය සඳහා වෙන්කොට ඇති අවකාශය පිළිබඳ විශ්ලේෂණය**

| පුවත්පතේ නම | සංවර්ධනාත්මක තොරතුරු | % | Space for Development - මුළු ප්‍රතිශත ඒකතුව | සාමාන්‍ය අගය |
|---|---|---|---|---|
| Ada | 20 | 1.7 | 0.89 | 0.13 |
| Ceylon Today | 59 | 5.0 | 27.25 | 2.73 |
| Daily News | 38 | 3.2 | 31.25 | 1.56 |
| Dialy Mirror | 59 | 5.0 | 36.25 | 3.30 |

| | | | | |
|---|---|---|---|---|
| Dinamina | 169 | 14.4 | 28.25 | 1.49 |
| Dinapatha Lanka-deepa | 36 | 3.1 | 12.25 | 1.23 |
| Diwaina | 22 | 1.9 | 8.9 | 0.89 |
| Lakbima | 18 | 1.5 | 6.45 | 0.72 |
| Mawbima | 40 | 3.4 | 26 | 2.60 |
| Randiwa | 19 | 1.6 | 6.25 | 1.25 |
| Rawaya | 15 | 1.3 | 13 | 1.86 |
| Resa Dinapatha | 37 | 3.2 | 9.5 | 1.90 |
| Silumina | 60 | 5.1 | 22.25 | 1.59 |
| Sunday Observer | 58 | 5.0 | 29.25 | 2.09 |
| The Island | 74 | 6.3 | 29.25 | 1.83 |
| The Nation | 46 | 3.9 | 19.25 | 2.75 |
| The Sunday Lead-er | 49 | 4.2 | 27.25 | 2.73 |
| The Sunday Times | 138 | 11.8 | 22.25 | 3.71 |
| Thinakaran | 82 | 7.0 | 2.80 | 0.19 |
| Thinakural | 109 | 9.3 | 3.10 | 0.22 |
| Veerakesari | 22 | 1.9 | 1.75 | 0.11 |
| | 1170 | 100.0 | | 1.61 |

මූලාශ්‍රය - සමීක්ෂිත දත්ත,2020, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තු

යථෝක්ත වගුවට අනුව සළකා බලනු ලබන ජාතික පුවත්පත් 21 අතරින් මානව සංවර්ධනය සඳහා සම්පූර්ණ පුවත්පතෙහි වපසරියෙන් වෙන්කොට ඇති අවකාශයෙහි සමස්ත සාමාන්‍ය අගය වන 1.61ට වඩා සමාන හෝ ඉහළ අගයක් ලබා දී ඇති පුවත්පත් සංඛ්‍යාව 10කි. පුවත්පත සංඛ්‍යාවෙන් 50%ටත් වැඩි ප්‍රමාණයක් එනම් 52.4% මානව සංවර්ධනය සඳහා සමස්ත පුවත්පත් වෙන් කොට ඇති අවකාශයෙහි සාමාන්‍ය අගයටත් වඩා අඩු දායකත්වයක් දක්වා ඇත. සමස්තයක් ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් පළවන පුවත්පත්හි මුළු ප්‍රතිශත එකතුව ඉහළ අගයක් එනම් වැඩි දායකත්වයක් දක්වා ඇත. එහිදී ඡසකහ හැඹි පුවත්පත හැර අනෙකුත් සියලුම ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත් මානව සංවර්ධනය සඳහා වෙන්කොට ඇති අවකාශයෙහි සමස්ත සාමාන්‍ය අගයට වඩා ඉහළ සාමාන්‍ය අගයක් පවත්වා ගනිමින් සළකා බලනු ලබන පුවත්පත් අතරින් ප්‍රධානත්වයක් දරනු ලබයි. තවද මෙම සියලුම පුවත්පත් මගින් මානව සංවර්ධනය සඳහා අවකාශය වෙන් කිරීමේදී ඒ සඳහා කිසිඳු ඉඩක් ලබා දීමක් නොවූ අවස්ථාවක් නිරීක්ෂණය වීමත් එහි අවම අගය ¯0 ලෙස සඳහන් වීමෙන් පැහැදිළි වන අතර උපරිම ලෙස එම දායකත්වය ලබා දී තිබෙනුයේ සමස්ත පුවත්පතින් 10%ක ප්‍රමාණයක් බව එහි උපරිම අගය 10 ලෙස සඳහන් වීමෙන් පැහැදිළි වේ. ඒ අනුව සළකා බලන ලද ජාතික පුවත්පත් 21 මගින් එක් කලාපයකදී ලබා දී ඇති උපරිම ඉඩ ප්‍රමාණය සමස්ත පිටු ගණනින් 10% වැනි ප්‍රමාණයක් බව තහවුරු වේ.

මේ අනුව පැහැදිළි වන්නේ සමීක්ෂණයට භාජනය කරන ලද පුවත්පත් පොදුවේ සළකා බැලූ විට ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත් මානව සංවර්ධනය සඳහා පුවත්පතෙහි වැඩි අවකාශයක් ලබා දී ඇති බවත් පොදුවේ සළකා බැලූ විට සමස්තය ඒ සඳහා ලබා දී ඇති දායකත්වය අවම මට්ටමක පවතින බවත් නිගමනය කළ හැකිය.

# 5 සාරාංශය

ශ්‍රී ලංකාවේ පුවත් පත් කලාව ආරම්භ වී වසර දෙසීයකට ආසන්න කාලයකි. ක්‍රි.ව. 1802 දී පළ වූ ආණ්ඩුවේ ගැසට් පත්‍රය පළමු වාර ප්‍රකාශනයයි. ප්‍රථම පුවත්පත වන්නේ 1832 නිකුත් වූ "ද කලම්බු ජර්නල්" ප්‍රථම පුවත් පතයි. ලංකා නිධානය පළමු සිංහල පුවත් පතයි. මුල් යුගයේ දී, ආගම් ප්‍රචාරය පුවත්පතෙහි ප්‍රධාන අරමුණ වී තිබිණි. 1977න් පසු බිහි වූ විවෘත ආර්ථිකය සමග විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලියවුණු පුවත්පත් බිහිවිය. පුවත්පත් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ උදෙසා වර්තමාන පුවත්පත් කලාව මෙහෙයවන්නේ ද යන්න පවතින ගැටළුවක් බව හඳුනාගත හැකිය. ප්‍රතිපත්ති සම්පාදනයේ සිට එහි ප්‍රතිලාභ ජනතාවට ලැබෙන තෙක් පාඨකයා දැනුමෙන්, ආකල්පයෙන් සන්නද්ධ කිරීමට පුවත්පත් කලාවට හැකියාව පැවතුන ද වර්තමානයේ වාණිජමය පරමාර්ථයෙන් පුවත්පත මුද්‍රණය වන බව ප්‍රකට කරුණකි. මෙවැනි තත්ත්වයක් තුළ මානව සම්පත් සංවර්ධනය උදෙසා පුවත්පත භාවිතා කිරීම අභියෝගයකි.

මෙම සමීක්ෂණය මගින් වසර 100ක තෝරාගත් පුවත්පත් භාවිත කොට මානව සංවර්ධනයට පුවත්පත කොතරම් බලපෑමක් කර ඇත් ද යන්න අධ්‍යයනය කර ඇත. සමීක්ෂණය සඳහා සිංහල 45.5%ක් ද ඉංග්‍රීසි 35.7%ක් ද දමිළ 18.7%යන මාධ්‍යයන්ගෙන් ප්‍රතිශතාත්මක ලෙස භාවිත කර ඇත.

ප්‍රධාන සංඛ්‍යාත්මක අනුමිතීන් අනුව එළඹිය හැකි නිගමනයන් රාශියකට එළඹිය හැකිය. පුවත්පත් භාවිතා කරන වයස් පරතරයන් හා එදිනෙදා තොරතුරු ලබා ගැනීමට පුවත්පත් මාධ්‍ය භාවිතා කිරීම අතර සම්බන්ධයක් ඇත. මේ සඳහා සහභාගී වූ පාඨකයන්ගේ දත්තයන් අනුව (25-45) කාණ්ඩයේ අය වැඩිම වශයෙන් පුවත්පත් භාවිතා කරයි. තොරතුරු ලබා ගැනීමට (25-45) කාණ්ඩයේ අය සෙසු වයස් කාණ්ඩයන්ට වැඩියෙන් රූපවාහිනී මාධ්‍ය භාවිත කරයි. ගුවන් විදුලි මාධ්‍යය භාවිතය ද (25-45) වයස් කාණ්ඩයේ අය සෙසු වයස් කාණ්ඩ වලට සාපේක්ෂව වැඩි අගයක් ගෙන ඇත. මේ අනුව, පොදුවේ තොරතුරු භාවිතයේ දී, වැඩි උනන්දුවකින් කටයුතු කරන්නන් (25-45) වයස් කාණ්ඩයේ බව පෙනී යයි. සතිපතා පුවත්පත් හා දිනපතා පුවත්පත් කියවීමේදී ද පෙරමුණ ගෙන ඇත්තේ (25-45) වයස් කාණ්ඩයේ අයයි. එම කාණ්ඩයේ පුද්ගලයින් සෙසු වයස් කාණ්ඩය හා සලකන විට සමාජයේ සිදුවන දේ ගැන අවධියෙන් සිටින්නේය යන නිරීක්ෂණය වේ. සමාජයේ යම් පරිවර්තනයක් කළ හැකි තීරණාත්මක වයස් කාණ්ඩයක් ලෙස ද (25-45) වයස් කාණ්ඩය සැලකිය හැකිය.

පුවත්පත් සියල්ලම සැලකූ කල ඒවායෙහි වැඩි වශයෙන් පළ වී ඇත්තේ වෙළඳ දැන්වීම්ය. අවම ලිපි ඇත්තේ විලාසිතා සම්බන්ධවයෙනි. මානව සංවර්ධනයට අදාල ලිපි වැඩිම වශයෙන් පළකර ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පලවූ පුවත් පත් වලයි. ඒ සඳහා වෙන් කර ඇති ඉඩ සෑම පුවත්පතකම ඉඩ 10% අඩුය.

මානව සංවර්ධනයට අදාළ තොරතුරු කියවීමට වැඩි කැමැත්තක් දක්වන්නේ ද (25-45) වයස් කාණ්ඩ වල පිරිස බව නිරීක්ෂණය වේ. සමාජය කෙරෙහි යම් බලපෑමක් කිරීමට ඇමතිය යුතු පිරිස් කාණ්ඩය ලෙස ද (25-45) අතර වයස් කාණ්ඩය ලෙස හඳුනාගත හැකිය. මීට අමතරව විනෝදාත්මක තොරතුරු කියවන්නේ ද, විශේෂාංග, අපරාධ පිළිබඳ තොරතුරු කියවන්නේ ද ඉහත කී වයස් කාණ්ඩයේ අයයි.

වෘත්තිය අනුව සලකන විට රජයේ සේවකයින් ද , රූපවාහිනී, ගුවන් විදුලි, පුවත්පත් සමාජ මාධ්‍ය ආදිය මගින් ලබා ගන්නා තොරතුරු පරිශීලනයට වැඩි නැඹුරුතාවයක් පවතින බව ද නිරීක්ෂණය වේ. වයස් කාණ්ඩ හා පුවත්පත් පිළිබඳ ධනාත්මක ආකල්ප දක්වන්නේ සෙසු කාණ්ඩ වලට සාපේක්ෂව (25 - 45) පුද්ගලයින් වන අතර සමීක්ෂණයට සහභාගි වූ එම වයස් කාණ්ඩයේ අයගෙන් 85% කට වැඩි ප්‍රතිශතයක් ධනාත්මක ප්‍රතිචාර දක්වා ඇත.

ප්‍රතිචාරකයාගේ රැකියාව හා සතිපතා පුවත්පත් හා දිනපතා පුවත්පත් කියවීම දෙකම සැලකූ කල රජයේ සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින්, ස්වයං රැකියාවන්හි නියැලෙන්නන්, රැකියා විරහිතයින් යන සියල්ලෙන්ම බහුතරයක් එදිනෙදා තොරතුරු ලබා ගැනීම සඳහා පුවත්පත් භාවිත නොකරන බව නිරීක්ෂණය වේ.

එසේම ප්‍රතිචාරකයාගේ රැකියාව හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ තොරතුරු කියවීම කෙරෙහි දක්වන කැමැත්ත සැලකීමේදී රජයේ සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන්, ස්වයං රැකියාවන්හි නියැලෙන්නන් හා රැකියා විරහිත යන සියල්ලන්ගෙන් බහුතරයක් මානව සංවර්ධනයට අදාල තොරතුරු කියවීමට රුචිකත්වයක් නොදක්වන බව පෙනී යයි.

මානව සංවර්ධනය සඳහා ජාතික පුවත්පත් දක්වා ඇත්තේ කුමන ආකාරයේ බලපෑමක්ද යන්න පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණය මත පදනම්ව මෙසේ සාරාංශ කර දැක්විය හැකිය.

# 6 යෝජනා සහ නිර්දේශ

- සමීක්ෂණය මගින් ලැබී ඇති දත්ත අනුව (15-24), (25-45), (46-60), 60+ යන වයස් කාණ්ඩ අතරින් සෑම තොරතුරු ලබා ගැනීමේ මාධ්‍යයකට වැඩිම ප්‍රතිශතයක දායකත්වය ගෙන ඇත්තේ (25-45) වයස් කාණ්ඩයයි. අනෙකුත් වයස් කාණ්ඩ වලට පොදුවේ තොරතුරු ලබා ගැනීමේ වුවමනාව ගිලිහී ඇති බවක් නිරීක්ෂණය වේ. මෙහිදී පුවත් පත් මාධ්‍යය කෙරෙහි අවධානය යොමුකරන විට වයස (15-24) කාණ්ඩයේ තරුණයින්ගේ ආකල්ප සංවර්ධනයට, ඔවුන්ගේ සිතුම්,පැතුම් හා සමගාමී වීමට පුවත් පළ කිරීම කෙරෙහි අවධානයට යොමුකල යුතු බව යෝජනා කෙරේ.

- ඊට අමතරව (46-60) හා (60)+ යන සමාජයේ පරිණත කොටස් ආමන්ත්‍රණය කළයුතු ආකාරය පිළිබඳ නව ප්‍රවේශයකින් කටයුතු කළයුතු බව යෝජනා කෙරේ.

- වයස් කාණ්ඩය හා පුවත්පත් සම්බන්ධයෙන් වන ආකල්ප සැලකුවිට සියලුම වයස් කාණ්ඩවල පුද්ගලයින් 80% ප්‍රමාණයකට පුවත්පත්වල පළවන තොරතුරු පිළිබඳ ධනාත්මක විශ්වාසයක් පවතී. දත්ත නිරීක්ෂණය කිරීමේදී පුවත්පත් තොරතුරු පිළිබඳ අසුබවාදී ආකල්ප දරණ 20% පිරිසක් සෑම වයස් කාණ්ඩයකම සිටින බව නිරීක්ෂණය වේ. මේ පිරිස ආමන්ත්‍රණය සඳහා නව වැඩ පිළිවෙලක් දියත් කළයුතු බව යෝජනා කෙරේ.

- 2021 වසරේ සිට මානව සංවර්ධනය හා සමාජ සංවර්ධනය ආදි ක්ෂේත්‍ර වලට අදාල ලිපි අවම වශයෙන් 25% වත් ජාතික පුවත්පත් සඳහා එකතු කළයුතු බව යෝජනා කෙරේ.

- මානව හා සමාජ සංවර්ධනය විෂයයන් පිළිබඳ මාධ්‍ය ආයතන කාර්යමණ්ඩල දැනුවත් කිරීමට වැඩමුළු පැවැත්වීමට යෝජනා කෙරේ.

## පාඨක අදහස් ....

### පුෂ්පා රම්‍යානි ද සොයිසා මෙනවිය

"පත්තර පසුවිපරම් වලට  ඉතා වැදගත්. එය අවශ්‍ය විට භාවිත කළ හැකියි. ඉස්සර කාලෙ නම් ගොඩාක් ප්‍රයෝජනවත් පුවත් තිබුණා. අද වන විට අවශ්‍යතාවය සොයා බලා තොරතුරු ලබාදෙන ස්වභාවයේ ව්‍යුහය  වෙනස් කරනවා නම් එය ඉතා වැදගත් ".

### සද්ධා උත්පලකන්දගේ මහතා

"අළුතෙන් පාඨකයා අතට පත් වූ පුවත්පත් කිහිපයකම මිනිසුන්ට අත්‍යවශ්‍ය  තොරතුරු රාශියක් තිබෙනවා. මිනිසුන් අද ශාස්ත්‍රීය ලිපි කියවන්න කැමතියි. අධ්‍යාපන පුවත්පත් යම් තරමකට හොඳයි. ඒත් පොදුවේ චින්තනය පුළුල් කිරීමට මීට වඩා මැදිහත් නව එක හොඳයි. සමාජ මතවාද ධනාත්මකව ගොඩනැඟීමට ප්‍රවෘත්තියකට ඇති හැකියාව අතිමහත්. සකල මාධ්‍යන්ගේම ප්‍රමිතීන් ගොඩනැඟිය යුතුයි ".

### මහාචාර්ය සේන නානායක්කාර මහතා - රජරට විශ්වවිද්‍යාලය

" රටේ සංවර්ධනයට හා සමාජ ප්‍රගමනයට බරපතල බලපෑමක් කළ හැකියි.1862 පුවත්පත් ආරම්භ කළ කාලයේ අරමුණු යම්තාක් දුරකට වෙනස් වී ඇත. වර්තමානයේ පවතින්නේ වාණිජත්වය සහ ලාභය මුල් කර ගත් ප්‍රවේශයක්. නිදහස සෙවූ පාඨකයා පුවත්පතින් ඉවත් වෙනවා. පාඨකයා වෙනස්වීම , වෙනත් මාධ්‍යය භාවිතය මෙන්ම පුවත්පත වෙනත් මාධ්‍යය මඟින් කියවීමට හැකිවීම නිසා එහි අලෙවිය අඩු වී ඇත. එහෙත් ප්‍රමිතිය ඉහළ දැමීමෙන් අලෙවිය ඉහළ නැංවිය හැකියි. දියුණු රටවල E -Made  නිසා අලෙවිය වැඩි වී ඇත ".

### මහාචාර්ය ආරියරත්න කලුආරච්චි මහතා - සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති

" පුවත්පත් මඟින් කාලීන දේවල් වාර්තාවීම සිදු වේ. මානව සම්පත දියුණු කිරීම සඳහා යොමුවීම පිළිබඳව සාකච්ඡා අඩුයි. මම කැමතියි මගේ අත්දැකීමක් සඳහන් කරන්න. මම උපකුලපති කාලේ ශිෂ්‍යය සංගම් ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කළා. මම ඒකට මාධ්‍යය ආවරණය ලබා ගැනීම සඳහා මගේ මාධ්‍යය හිතවතෙකුට කථා කළා. ඔහු කිව්වේ අනේ සර් ලේ හලන ප්‍රවෘත්තියක් නම් පළමු පිටුවට දාලා දෙන්න තිබුණා කියලා. විශ්වවිද්‍යාල දරුවන් ගොඩාක් හොඳ ව්‍යාපෘති කරනවා. කවදාවත් ඒවා අපේ පුවත්පත්වල මුල් පිටුවල පළ වෙන්නෙ නෑ. ඒත් අයහපත් දෙයක් කළාම එය අනාරාධිතවම ආවරණය කරලා ප්‍රචාරය කරනවා. මාධ්‍යය මීට වඩා සමාජය දෙස සුභවාදීව සිතිය යුතුයි. ක්‍රියාකල යුතුයි. සාර්ථක වැඩසහන්, සාර්ථක ව්‍යාපෘති, සාර්ථක මිනිසුන්, සාර්ථක අත්දැකීම් ජනගත කිරීමට සකල මාධ්‍යයන්ම මැදිහත් විය යුතුයි. සමාජය ශෝධනය කිරීමට,සමාජ මඟපෙන්වීමට මැදිහත් විය යුතුයි. සමාජය සුවපත් කිරීමට මාධ්‍යය අදට වඩා මැදිහත් වීමක් ලබා දිය යුතුය".

### අමිත්ත වීරසිංහ මහතා - ප්‍රවීණ කලාකරු

පුවත්පත් වනාහී වත්මන් තාක්ෂණික ලෝකය හමුවේ ජනතාව අතරින් ප්‍රතික්ෂේප වූ යල් පිනූ මාධ්‍යයක් ලෙස හැඳින්වීම නිවැරදිය. මෙම මාධ්‍ය මගින් මානව සම්පත් සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කිරීම සහ ඒ සඳහා වැඩි අවකාශයක් ලබා ගැනීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම අගනා නමුත් එබඳු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරවීම පහසු නොවන්නේ ය. මානව සම්පත් සංවර්ධනය සඳහා ජාතික පුවත්පත් මගින් සුවිශාල හා සුවිශේෂී වූ කර්තව්‍යයන් ඉටු කළ හැකි බව මාර්ටින් වික්‍රමසිංහ වැනි වියතුන්, විෂය ප්‍රාමාණිකයන් දිනමිණ වැනි ජාතික පුවත්පත්වල කර්තෘ ධුර හෙබවූ කාල පිළිබඳව අධ්‍යයනයෙන් පැහැදිලි වේ. සාහිත්‍යය පිටුව ගලවා දමා ඒ වෙනුවට දැන්වීම් දමන පුවත්පත් බහුල මෙකල එමගින් මානව සම්පත් සංවර්ධනය සිදු කරන්නේ කෙසේදැයි ප්‍රශ්නාර්ථය මතු කරන නමුත් ඒ වෙනුවෙන් දරන උත්සාහයන් හදවතින්ම අගය කළ යුතුව තිබේ.

### ආචාර්ය සුනිල් රණසිංහ මහතා - මානවවිද්‍යාව

මානව සංවර්ධනය යනු ශිෂ්ට සමාජයක් සඳහා මානවයා හැඩගස්වන, වෙනස්වෙමින් ගලා යන, අඛණ්ඩ ප්‍රවාහයකි. එහෙත් මානවයා තවමත් ශික්ෂාකාමී සොබාදහම සමඟ සමෝධානගත ජීවියෙකු නොවේ. ලාභය ලුහුබඳින සංකීර්ණ තරඟකාරී සමාජයක සංවර්ධනය පිළිබඳ මාධ්‍යය දැක්ම අතිශයින්ම ව්‍යාකූල විකෘතියකි. 1980 විවෘත ආර්ථිකයත් සමඟ මාධ්‍යය කර්මාන්තයට ප්‍රවේශ වූයේ නොහික්මුණු පාදඩ ධනේශ්වරයයි. ඔවුන්ගේ ඒකායන අරමුණ අධික ලාභයයි. එම අභිලාෂය උදෙසා වංචනික දේශපාලන, වාර්ගික උන්මාදය, ගතානුගතික ආගමික සහ මිත්‍යාමතික විශ්වාස, වෙළඳපොළ ප්‍රචාරණය සහ ලිංගික ආශා උත්තේජනය අවිනීතව බෙදාහරී. මානව සංවර්ධනයේ සැබෑ අරමුණු මඟහරිමින් හෝ අවැදගත් විෂයක් ලෙස නොසලකාහරිමින් පරිභෝජන මතවාදය ප්‍රවර්ධනය කරයි. මාධ්‍යය සදාචාරය සහ පොදු එකඟතා උල්ලංඝණය කරමින් ඔවුහු සමස්ත සමාජය දූෂණයට සහ ප්‍රචණ්ඩත්වයට පොළඹවති. එවන් මාධ්‍යය කර්මාන්තයකින් මානව සංවර්ධනයේ සැබෑ අස්වැන්න නෙළාගැනීමට වෙර දැරීම හිතළුවකි. අවසානයේ මෙම ව්‍යාකූලත්වය මානව සමාජ ප්‍රගමනයට (සංවර්ධනයට) නොව ශිෂ්ටාචාරයේ අර්බුදයක් දක්වා සමස්ත සමාජයම කැඳවා යනු නියතය.

### නිමල් කරුණාසිරි මහතා - හිටපු ආයුර්වේද කොමසාරිස්

"මම හැමදාම මාධ්‍යය වලට කියන්නේ සුවදායී සාර්ථක දේවල් ජනගත කරන ලෙසයි. 1970 පසු ක්‍රමිකව Constructive Criticism නොව Distractive Criticism සිදු කිරීම ඉතා කනගාටුදායකයි. අපි ඊශ්‍රායලය ගත්තත් මොනතරම් යුධමය තත්වයන් තිබුණ ද ඔවුන්ගේ මාධ්‍ය තුළ පෙන්වන්නේ ගොඩනැගීම සඳහා තොරතුරුයි. පර්යේෂණාත්මක ප්‍රවේශයක් අවශ්‍ය වන්නේ නැහැ. මොනතරම් විවේචන තිබුණත් හොඳ යහපත් දේවල් ජනගත කළ යුතුයි ".

### එම්.එන්.එම්.නුබසීර් මහතා - විද්‍යාර්ථයෙක්

"මම පත්තර කියවන්නේ E-Version එකෙන්. ඒත් කියවන්නේ ඉංග්‍රීසි පත්තර පමණයි. ලෝකයේ පුවත්පත් එක්ක සන්සන්දනය කරද්දි අපේ පුවත්පත්වල අපූර්වත්වය, ආකර්ෂණීය බව මදි කියලයි මම හිතන්නේ. තාරුණ්‍යයේ හැඟීම්, සැබෑ අවශ්‍යතා මාධ්‍යය තේරුම් අරන් තියෙන ප්‍රමාණය ප්‍රමාණවත් නෑ කොහෙත්ම. ලෝකයේ තාක්ෂණික දියුණුවත් සමඟම සමාජ වෙනසත් සමඟ පුවත්පත්වල හැඩය සාධනීය වෙනසක් ගෙන තියෙනවා. මේ ගැන පර්යේෂණාතමකව ගවේශණාත්මකව කරුණු සලකා බැලිය යුතුයි ".

### ජේ.බාලසිංහම් මහතා - ව්‍යාපාරික

"මම කියවන්නේ දෙමළ පුවත්පත්.ඊට අමතරව ඉංග්‍රීසි පුවත්පතුත් කියවනවා. පත්තරයක් ගත්තම ප්‍රයෝජනවත් තොරතුරු තියෙන්නේ සාපේක්ෂව අඩුවෙන්. බොහෝ දෙනා පුවත්පත් කියවන්නේ නැත්තෙ ඒකයි. කියෙවුවත් කියවන්නේ වෙළඳදැන්වීම් බලන්න. ජීවිතයට පුවත්පතෙන් එකතු කර ගත හැකි ප්‍රමාණය අඩුයි ".

### එම්.එන්.එෆ්.නයිසාරා මෙනවිය - වෛද්‍ය ශිෂ්‍යාවක්

" මම පත්තර කියවන්නේ E-Version එකෙන්. මම ඉගෙන ගන්නේ රුසියාවේ.එහෙ පුවත්පත්වල 60% -70% ක් තියෙන්නේ සාධනීය කරුණු. ජනජීවිතය ගොඩනංවන කරුණු. අපේ අති බහුතරයක් සිංහල මාධ්‍යය පුවත්පත් හරිම දුර්වලයි. ඒක නිසාම ඒ පුවත්පත්වල අලෙවිය අඩු වෙලා තියෙනවා. රුසියාවේ ලේඛකයින් , පුවත්පත් මාධ්‍යයවේදීන් ගවේශකයෝ. එක ලිපියක් ලියන්න ගොඩාක් මහන්සි වෙනවා. අපේ රටේ සුන්දර දේවල්, සුන්දර මිනිසුන් ගොඩාක් ඉන්නවා. ඒත් මාධ්‍යයවේදීන්ගේ ඇසට කුණු කන්දල් විතරක්ම පේන්නේ මේ සමාජ ආර්ථික රටාව නිසාම වෙන්න ඇති සමහර විට ".

### දර්ශන රුවන් දිසානායක - තරුණ සංගීතවේදී

" ජාතික පුවත්පත් සියල්ල නිදහසින් පසුව ද දිනෙන් දින පරිවර්තනය වන අධිරාජ්‍යවාදී වික්ටෝරියානු රදල වහල් ඊනියා සමාජ සංස්කෘතිය තුළ බලයලත් පාලක පංතිය හා ගැටෙමින් පොර බදිමින් මේ ලක් පොළවේ උපදින ආශ්චර්යවත් මානව සම්පත ඔසවා තැබීමට අඩු වැඩි වශයෙන් ඒ ඔවුන් සතු ජනතා පරමාධිපත්‍යය වැය කරමින් ජීවිතය ද පරදුවට තබා කැපකිරීම් කළහ ".

### මොහමඩ් මහීෂ් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

වර්තමාන ලාංකික සමාජය තුළ තරුණ ප්‍රජාව පුවත්පත් හා සම්බන්ධ නොවේ. පුවත්පත් සමඟ සම්බන්ධතාවය දක්වන්නේ වයස අවුරුදු 50 පමණ ඉක්ම වූ විශ්‍රාමික පිරිස වේ. වර්තමාන සමාජය හා පුවත්පත් අතර ලඟ සම්බන්ධතාවයක් නොමැති බැවින් සාමාන්‍ය ප්‍රජාව වෙත ලඟාවීමට අසීරුවී ඇත. පොදුවේ ගත් කල පුවත්පතින් තරුණයා ඈත්වීම සිදු වී ඇත.

### ජයන්ත වත්තෙවිදාන මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පුවත් පත් සතු ජනතාවාදී භූමිකාව

ගෙවී ගිය සියවස් දෙකක පමණ කාලයක් පුරා දේශීය පුවත් පත්, සියලු ජනමාධ්‍යය අතර ප්‍රධානියා ලෙස සාම්ප්‍රදායික අයුරින් ප්‍රජාව වෙත තොරතුර සැපයීම සිදු විය. පුවත් පමණක් නොව ඒ පිළිබඳ අදහස් දැක්වීම එමෙන්ම පාලකයන් ජනතාවාදී නොවන අයුරින් අනිසි ලෙස බලය භාවිත කිරීම, එවැනි තීරණ ගැනීම, සම්පත් හා මුදල් අව භාවිතය සිදු කරන අවස්ථාවල දී ඒවාට එරෙහි ලෙස ජනතාව බල ගන්වමින් පෙළ ගැස්වීමට ද පුවත් පත් මගින් සැළකිය යුතු දායකත්වයක් සිදුවූ බව මගේ හැඟීම යි. තවද භාෂා සාහිත්‍ය, දර්ශනය වැනි විෂයයන් පිළිබඳ සංවාදයන් ගොඩනගමින් ජන චින්තනය පුබුදුවාලීම පිණිස ද පුවත් පත් කලාවේදීන් ගෙන් සිදු වූ මෙහෙවර ලඝු කළ නොහැකිය. කෙසේ වෙතත් පසුගිය දශක හතරක පමණ කාලය තුල පුවත් පත් මගින් ඉහත කී භූමිකා පූරණය කෙතෙක් සිදුවූවා දැයි සියුම් ලෙස විමසා බැලිය යුතු ය. විවිධ පුවත්පත් ආයතන බලය හා මුදලට නතුව ඉටු කරමින් සිටිනුයේ ජනතාව වෙනුවෙන් වූ න්‍යාය පත්‍රයක් නොවන බව එතරම් අපහැදිලි නොවන බව පෙනෙයි. ජන මනස කුණු රසයෙන් කුල්මත් කළ හැකි ඕපාදූප සඳහා මුල් තැනක් දෙමින් ආගම්, කුල හා ජන වර්ග ලෙස ප්‍රජාව තුල බෙදීම් ඇති කිරීම සඳහා ද පුවත් පත් ප්‍රමුඛ ජනමාධ්‍යය වගකීම් විරහිත ලෙස ක්‍රියා කරන බවක් ද පෙනී යයි. වෙළඳ දැන්වීම් වල ප්‍රමිතිය පිළිබඳ වද කිව හැක්කේ කෙසේවත් ජනතා හිත සුව නොතකන බවයි.

## සමීක්ෂණය පිළිබඳ විද්වත් මතයන්...



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යසාංජලී  දේවිකා ජයතිලක**
අධ්‍යයනාංශ ප්‍රධාන
මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව  විසින් ශ්‍රී ලංකාවේ  ජාතික පුවත්පත් මානව සම්පත් සංවර්ධනය සඳහා දක්වන දායකත්වය  යන මැයෙන් සිදු කරන ලද සමීක්ෂණය ඉතා ප්‍රායෝගික වැදගත්කමකින් හෙබි අධ්‍යනයක් ලෙස දකිමි. නූතන පරපුර පුවත්පත් ඇතුළු පොත්පත් කියවීමෙන් දුරස්වෙමින් සිටින බව අප කාටත් නොරහසකි. පුවත්පතක් කියවීම මඟින් සිය දැනුම යාවත්කාලීන වනවා පමණක් නොව තමා ජීවත්වන සමාජයේත්, ලෝකයේත් වන සිදුවීම් හා තොරතුරු පිළිබඳව නිවැරදිව දැන ගැනීමට අවස්ථාව සැලසේ. එහෙත් නවීන තාක්ෂණයට වඩාත් ලොල් වී ඇති නව පරපුර තොරතුරු හා දැනුම සොයා යාමේදී භාවිත කරනුයේ පුවත්පතකට වඩා මුහුණු පොත, අන්තර්ජාලය, දුරකථන යෙදවුම් වැනි උපාංගයන්ය. මෙමඟින් කියවීම මඟින් ලබාදෙන රසවින්දනය ඔවුන් හට අහිමිවීම මඟින් භාෂා  ඥානය හීනවීම, දැනුම වර්ධනය නොවීම , සාවද්‍ය තොරතුරු මඟින මං මුලාවීම, පරිකල්පනය උද්දීපනය නොවීම ආදී වශයෙන් අඩුපාඩුවලින් සමන්විත පරපුරක් නිර්මාණය වීම වළකාලීමට අපහසුවී තිබේ. මෙවන් පසුබිමක ජාතික පුවත්පත් මානව සම්පත් සංවර්ධනය සඳහා දක්වන දායකත්වය පිළිබඳව විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් අධ්‍යනයක් සිදු කිරීමටත් එමඟින් කියවීමට මිනිසුන් යොමු කිරීමේ උපායමාර්ග සොයා බැලීමත් ඉතා කාලෝචිත යැයි සඳහන් කිරීමට කැමැත්තෙමි.

## සමීක්ෂණය පිළිබඳ විද්වත් මතයන්...



**ආචාර්ය ටියුඩර් වීරසිංහ**
ශ්‍රීපාලී මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

පුවත්පත්වල ඉතිහාසය , එහි ආරම්භය හා සංවර්ධනය ලෝක ශිෂ්ඨාචාරවල ඉතිහාසය සමග සමීපව සම්බන්ධ වේ. පුවත්පත හා මානව සංවර්ධනය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. නූතන සමාජ සංවර්ධනය හා සුරක්ෂිතතාවය සඳහා ගුණාත්මක සහ කාලෝචිත තොරතුරු ප්‍රධාන වගකීමක් දරන්නේය. ඒවා නිර්මාණය කිරීම, ව්‍යාප්ත කිරීම අධ්‍යතන පුවත්පත් ඇතුලු සංහේතික මාධ්‍යයේ ප්‍රමුඛතම කාර්යයකි. සමාජ ජීවිතයෙහි ලා පුවත්පත්වල කාර්යභාර්ය අතිමහත්ය.

පුවත්පත්, සඟරා සංස්කෘතිය හා විද්‍යාවේ ජයග්‍රහණ පරම්පරාවෙන් පරම්පරාවට සංරක්ෂණය කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන මාධ්‍ය වේ. සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයින් සඳහා පුවත්පත් දැනීමේ ප්‍රභවයක් ලෙස සේවය කරයි. ජීවිතය දැන ගැනීමට සහ අගය කිරීමට උපකාරී වේ. එසේම සමාජ සම්බන්ධතා, ස්වභාවික ප්‍රපංච තේරුම් ගැනීමට ආධාරක වේ. පුද්ගලයාගේ සහ සමාජයේ වර්ධනය සඳහා අවශ්‍ය දෘෂ්ඨිවාද සදාචාරාත්ම පරමාදර්ශයන් ගොඩනැගීම සහ සමාජ හැසිරීම්වල ප්‍රමිතීන් හා සම්මතයන් ස්ථාපනය කිරීම සඳහාත් පුවත්පත්වල භූමිකාව සුවිශාලය.

සමාජය සහ ජීවිතය වෙනස් කිරීමට ,විපරිවර්තනය කිරීමට ඇවැසි ජනමතය නිර්මාණ කිරීමේ ප්‍රබලම උපකරණය වන්නේ පුවත්පතයි. ඇත්ත වශයෙන්ම පුවත්පත යනු ප්‍රචාරකයෙකු සහ උද්ඝෝෂකයෙකු පමණක් නොව සාමූහික සංවිධානයකි.වසර 200 ක පමණ ඉතිහාසයක් අනුව පුවත්පත් ශ්‍රී ලාංකීය සමාජයෙහි ලිබරල්වාදී සමාජවාදී, ජාතිකවාදී විවිධ ප්‍රගමනාත්මක අදහස්, දෘෂ්ඨිවාද ව්‍යාප්ත කර ලීමෙහි ලා සුවිශාල මෙහෙවරක් සිදුකර ඇති බව පෙනේ.ජාතික නිදහස අත්පත් කර ගැනීම සහ එය ශක්තිමත් කිරීම සඳහාත් ත්‍රස්තවාදී, බෙදුම්වාදී යුද්ධය පරාජය කිරීම සඳහා අවශ්‍ය වූ ජනමතය ගොඩනැගීමෙහි ලා පුවත්පත් ඉටුකළ භූමිකාව කැපී පෙනේ.

නමුත් පශ්චාත් නිදහස සමග පශ්චාත් සංග්‍රාමික ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය සඳහා සංවර්ධනාත්මක අභියෝග ජය ගැනීම සඳහාත් ජාතික සමඟිය, සහජීවනය සහ සුරක්ෂිතතාව ගොඩනැගීම සඳහා වන ජනමතයක් ගොඩනැගීමට ද පුවත්පත් අසමත්වී ඇත. පශ්චාත් නිදහස් ලංකාවේ මානව සම්පත් සංවර්ධනයට පාදක වන මූලික ගැටලු තුනක් විසදා ගැනිමෙහි ලා ජාතික පුවත්පත්වල භූමිකාව අතිශයින්ම දුර්වල බව ප්‍රකාශ කළ යුතුය. එම ගැටලු තුන වන ශ්‍රී ලංකාවට ගැලපෙන රාජ්‍ය ව්‍යුහයක් ගොඩනැගීම ශ්‍රී ලංකාවට යෝග්‍ය සමාජ ආර්ථික ආකෘතියක් සකස් කරගැනීම සහ පොදු ශ්‍රී ලාංකීය දෘෂ්ඨිවාදයක් නිර්මාණය කිරීමට අදාලව සමාජ සංකතිකාව සංවිධානය කිරීමේ ප්‍රධානම යන්ත්‍රණය වන පුවත්පත් වගකීම සහ භූමිකාව ඉටු නොකළේය.


ශ්‍රී ලංකාවේ පුවත්පත් සමාජ සහ ජාතික සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය අතිශයින්ම පහළ බව විද්‍යාත්මකව පෙන්වා දෙන්නේ මෑතක දී ශ්‍රී ලංකාවේ පුවත්පත් මානව සම්පත් සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය පිළිබඳව මිනිස් බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද සමීක්ෂණය මඟිනි.

සමාජ සංවර්ධනය කෙරෙහි යොමු වූ අප ඉහත ගෙන හැර  දක්වන ලද අභියෝග සහ ගැටලු නියෝජනය මෙන්ම ඒවා සාකච්ඡා කිරීමට වෙන් කර ඇති අවකාශය ජාතික පුවත්පත් වල ඉතා අවම මට්ටමක පවතින බව මෙම සමීක්ෂණය පෙන්වා දෙයි. සමීක්ෂණයට අනුව සමස්ථයක් ලෙස සංවර්ධනය පිළිබඳ ලිපි ජාතික පුවත්පත් වල 2% -8% ක් අතර අගයක් ගන්නා බව පෙන්වා දෙයි. ජාතික පුවත්පත් ප්‍රබල ප්‍රවණතාවයක් දක්වන්නේ සංවර්ධනය, මානව, ප්‍රභුද්ධ සදාචාරීය වටිනාකම් වලට වඩා වෙළඳ , ප්‍රාථමික, විනෝදාත්මක , මිත්‍යා, සාපරාධී වටිනාකම් වලට බව පැහැදිලිවේ.

ජාතික පුවත්පත් සමාජ සහ මානව  අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කරනවා වෙනුවට හුදු වුවමනාවන් වලට , ආශාවන්ට , සහජාසයන්ට ආමන්ත්‍රණය කරන බව පෙනේ. මේ නිසා ජාතික පුවත්පත් මඟින් සංවිධානය කරනු ලබන සමාජ සංකතිකාව ව්‍යාජ විඥ්ඥාණික, හරසුන්, නිර්සමාජීය ,උදාසීන හා නිෂ්ක්‍රීය ස්වභාවයක් ගන්නේය. එය මානව හා ජාතික සංවර්ධනයට ප්‍රබල බාධාවකි. තර්ජනයකි. මේ නිසා ජාතික පුවත්පත් වල කාර්ය භාර්ය සංවර්ධනාත්මක සහ ධනාත්මක අදහස්, ආකල්ප, පරමාදර්ශ සහ වටිනාකම් ජනගත වන ආකාරයට විචාරාත්මකව සහ නිර්මාණාත්මක රාමුවක් තුළ ප්‍රතිසංවිධානය විය යුතුය. එනම් දැනට ජාතික පුවත්පත් ක්‍රියාත්මක වන වාණිජවාදී  පෘෂ්ඨීය, දේශපාලන , අවිචාරාත්මක තත්වයෙන් ඉවත්ව ප්‍රබුද්ධ සංවර්ධනාත්මක, සුසමාදර්ශයකට මාරුවිය යුතුය. ඒ සඳහා ජාතික පුවත්පත් වල පලවන මානව,සමාජ,ජාතික සංවර්ධනය පිළිබඳ තොරතුරු ප්‍රමාණාත්මකව වැඩි කර එහි ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කළ යුතුය.ජාතික කථිකාව සංවිධානය කිරීමේ දී දැනට පුවත්පත් ඇතුළු මාධ්‍යය ගෙනයන හුදු ජනප්‍රිය,ප්‍රාථමික, දේශපාලන ප්‍රතිරූපක මට්ටමින් ඉවත්ව ප්‍රබුද්ධ, විචාරාත්මක,පර්යේෂණාත්මක ලක්ෂණවලට ප්‍රමුඛතාවය දිය යුතුය.

මෙකී කොටස සඳහා දැනට සමස්ත මාධ්‍යය අවකාශය තුළ වෙන් වී ඇත්තේ 2% ටත් අඩු කොටසකි. මෙය 50% දක්වා වැඩි විය යුතු බව අපගේ අදහසයි. එසේම මෙම ප්‍රශ්න පිළිබඳව රටේ ජනප්‍රිය දේශපාලන මතයට, ජනමතයට,ප්‍රබුද්ධ මතයට සමාන්තරව ස්වකීය පුවත්පත් මතයත් දෛනික සංතතික තලයට එක් කළ යුතුය. විශේෂයෙන්ම ඒ ඒ ක්ෂේත්‍ර වලට අදාලව විද්වත් හා විශේෂඥ අදහස්වලට ප්‍රමුඛතාව ලබාදීම වැදගත්ය. වර්තමානයේ පුවත්පත් ඇතුලු සමස්ත මාධ්‍ය ක්‍රියාකාරීත්වය යොමු වී ඇත්තේ මානව සම්පත සූරාකමින් එය අවභාවිතයේ යෙදවීමට බව පැහැදිලිය. මේ තත්වය වෙනස් විය යුතුය. පුවත්පත් ඇතුලු මාධ්‍යය පුද්ගල ලක්ෂණ සහ  මානව සම්පත සතු නෛසර්ගික ගුණ ,ශක්‍යතා සහ විභවතා සංවර්ධනය කිරීම කෙරෙහි යොමු වූ සුභාවිත මාධ්‍යකරණයක අවශ්‍යතාවය උක්ත සමීක්ෂණය මඟින් පෙන්වා දෙන්නේය.

## සමීක්ෂණය පිළිබඳ විද්වත් මතයන්...



**මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර**
මානව විද්‍යා අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

" සියක් අවුරුදු අධ්‍යනයෙන් 2030 ට " ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත් මානව සංවර්ධනය කෙරෙහි දක්වා ඇති දායකත්වය පිළිබඳ සමීක්ෂණය - 2020

උක්ත මාතෘකාවෙන් මෙහෙයවුණු සමීක්ෂණ වාර්තාව අධ්‍යනය කළෙමි. ශ්‍රී ලාංකික ජන සමාජය මතු නොව සමස්ත ලෝක සමාජයම අර්බුදයකට පත්ව පවතින අති දුෂ්කර කාල පරිච්ඡේදයක මේ සා වෙහෙස මහන්සියෙන් කරන ලද සමීක්ෂණය ඵලදායී අධ්‍යනයක් බැව් අතිශෝක්තියෙන් තොරව පැවසුව මනාය. සෑම අංශයකින්ම මානවයා සංවර්ධනය කිරීම සඳහා නොයෙක් උපක්‍රම භාවිත කරනු ලැබේ. මෙහිදී විෂයය සීමාව ලෙස සලකා ඇත්තේ ජාතික පුවත්පත් වේ. මෙම අධ්‍යනයෙන් විද්‍යාමාන වන කාරණා සහ පවතින ගැටලු අභියෝග ජයගැනීම උදෙසා සංවර්ධිත සශ්‍රීකවත් සෞභාග්‍යමත් දේශයක් - ජන සමාජයක් ගොඩනැගීමට උයෝගී කරගත හැකිවනු ඇතැයි විශ්වාස කරමි.

සඵලවේවා!

## උපදේශකත්වය

තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමන්

## මාර්ගෝපදේශය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන් මහතා
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඒ.විමලවීර මහතා

## ක්‍රියාකාරී මඟපෙන්වීම

අනුෂා ගෝකුළ ප්‍රනාන්දු මිය - අධ්‍යක්ෂ ජනරාල්
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

## අධීක්ෂණය

බී.එච්.සී.ශිරෝමාලි මිය - අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ සහ විදේශ සබඳතා)
සිතාරා ජයසේන මිය - අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ ප්‍රවර්ධන, වෘත්තීය මාර්ගෝපදේශ සහ මහජන රැකියා සේවය)
ලංකා කුලවංශ මිය - අධ්‍යක්ෂ (පාලන)
එල්. කේ. මුහන්දිරම්ගේ මිය - අධ්‍යක්ෂ වැ/බ ( ශ්‍රම වෙළඳපොළ තොරතුරු සහ පර්යේෂණ )
එල්.පී.එල්. ගුණරත්න මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොළ තොරතුරු සහ පර්යේෂණ)
ඩී.එම්.එස්.ආර්.ටී. දිසානායක මයා - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා ප්‍රගති මෙහෙයුම්)
ශානිකා මායාදුන්නේ මිය - සහකාර අධ්‍යක්ෂ (ජාතික මානව සම්පත් සහ රැකීරක්ෂා ප්‍රතිපත්ති )
එච්.ජී.කේ.දීපශිකා මිය - සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන)
එන්. සන්ජීපන් මයා - සහකාර අධ්‍යක්ෂ (මහජන රැකියා සේවය)

## සම්බන්ධීකරණය

ආර්.එස්.කේ. ගල්හේන මයා - මානව සම්පත් සංවර්ධන නිලධාරී
ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම
පී.ඒ.කේ.එන්.අතුකෝරළ මිය - සංවර්ධන නිලධාරී
පර්යේෂණ වාර්තාව සකස් කිරීම
ඒ.ආර්.ඩබ්.එම්.එස්.පී.අබේකෝන් මයා - මානව සම්පත් සංවර්ධන නිලධාරී
කේ.කේ.ඩී.කේ.එස්.සෝමරත්න මයා - මානව සම්පත් සංවර්ධන නිලධාරී
ආර්.එම්.ජේ.එච්.ගජනායක මිය - සංවර්ධන නිලධාරී
පී.ඒ.කේ.එන්.අතුකෝරළ මිය - සංවර්ධන නිලධාරී

## දත්ත රැස් කිරීමෙන් සහ පරිගණක ගත කිරීමෙන් සමීක්ෂණය සඳහා සම්බන්ධ වූ දෙපාර්තමේන්තු නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | සේවා ස්ථානය | දත්ත රැස් කරනු ලබන පුවත්පත් |
|---|---|---|---|---|
| 1 | පී.එච්.යූ.සී.ද සිල්වා මිය | ව්‍යාපෘති නිලධාරී | ප්‍රධාන කාර්යාලය | දිවයින |
| 2 | බී.එම්.අයි.හේමමාලී මිය | සංවර්ධන නිලධාරී | | Daily News |
| 3 | එස්. ශිවශක්ති මිය | මානව සම්පත් සංවර්ධන නිලධාරී | | උදයන් |
| 4 | එස්.නලිනි මිය | | | වීරකේශරී |
| 5 | ඒ.එස්.ඥානදේවා මිය | | | තිනකුරල් |
| 6 | ටී.එච්.රේණුකා මිය | | | මව්බිම - ඉරිදා |
| 7 | එෆ්.ෆ්ලොරීඩා මිය | සංවර්ධන නිලධාරී | | අද |
| 8 | කේ.එස්.ආර්.පී.ගුණසේකර මිය | | | රැස- ඉරිදා |
| 9 | ඊ.එල්.එන්.ඩී.පෙරේරා මිය | | | රාවය |
| 10 | එස්.ජේ.අයි.මධුවන්ති මිය | | | Sunday Times |
| 11 | ඩබ්.එම්.ජී.බණ්ඩාර මයා | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කොළඹ | The Island |
| 12 | ඩබ්.තමරා ප්‍රියන්ති මිය | මානව සම්පත් සංවර්ධන නිලධාරී | | ලක්බිම - සතිපතා |
| 13 | සී.පී.වීරරත්න මිය | | | ලංකාදීප -දිනපතා |
| 14 | නදීකා දමයන්ති මිය | | | සිළුමිණ - ඉරිදා |
| 15 | ඩබ්.ඒ.නයනා කුමුදුනී මිය | | පාදුක්ක | Daily Mirror |
| 16 | බී.එම්.එන්.පුෂ්පකුමාරි මිය | | කැස්බෑව | දිනමිණ - දිනපතා |
| 17 | සී.ඩබ්.ඒ.වීරසිංහ මිය | | දෙහිවල | Sunday Observer |
| 18 | කේ.පී.ආර්.එස්.ප්‍රේමචන්ද්‍ර මිය | | රත්මලාන | The Nation |
| 19 | ඒ.නන්දනී මිය | | හෝමාගම | රන්දිව |
| 20 | ඩබ්.එස්.කේ.විතාරම මයා | | සීතාවක | The Sunday Leader |
| 21 | ඒ.අනුෂියා මිය | | තිඹිරිගස්යාය | තිනකරන් |
| 22 | ටී.ජී.අරුණ කාන්ති මිය | | කඩුවෙල | Ceylon Today |
| 23 | එම්.ඒ.එස්.කේ.ශාන්ත මයා | | ප්‍රධාන කාර්යාලය | පාඨක මතය පිළිබඳ තොරතුරු ලබා ගැනීම එම තොරතුරු පරිගණක ගත කිරීම. |
| 24 | ඒ.ගුණරත්න මයා | | | |
| 25 | එම්.පේමරත්න මයා | | | |
| 26 | අචිනි ශානිකා පෙරේරා මිය | | | |
| 27 | ඒ.කේ.රිදීමාලියැද්ද මිය | | | |
| 28 | ආර්.පී.එන්.එස්.වර්ණසූරිය මිය | සංවර්ධන නිලධාරී | | |
| 29 | ජේ.ඩී.එල්.ජයවර්ධන මයා | | | |